රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

වාර්ෂික වාර්තාව

2024



ප්‍රවාහන ,මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

අන්තර්ගතය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	1
ආයතනික තොරතුරු	2-3
දැක්ම, මෙහෙවර සහ අරමුණු	4-5
අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්	6-7
ඉදිකිරීම් ව්‍යාපෘති පිහිටි ස්ථාන	8-9
නාවල-අංගම්පිටිය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියේ ඡායාරූප	10
ආයතනික පාලනය	11-16
කෙත්හේන ජල නල ව්‍යාපෘතියේ ඡායාරූප	17
2024 වර්ෂයේ කාර්ය සාධනය	18-19
මූල්‍ය සමාලෝචනය	20-28
ගැටඹේ ගේබියන් ව්‍යාපෘතියේ ඡායාරූප	29
මානව සම්පත් සමාලෝචනය	30-31
2024 වර්ෂයේ SD & CC මුහුණ දුන් අභියෝග	32
කෙටිකාලීන හා දිගුකාලීන වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග	33
විගණන කමිටු වාර්තාව — 2024	34-36
මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය	36
විගණකාධිපතිගේ වාර්තාව — 2024	37-45
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන	46
සම්පූර්ණ ආදායම් ප්‍රකාශය	47
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	48
කොටස් වෙනස්කම් ප්‍රකාශය	49
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	50
ගිණුම්කරණ ප්‍රතිපත්ති	52-62
මූල්‍ය ප්‍රකාශනවලට සටහන්	63-84
කළමනාකරණ විගණන වාර්තාව සහ පිළිතුරු	84-124
අමාත්‍ය මණ්ඩලයේ අවධානයට යොමු කළ යුතු කරුණු	125-127
වසර 10 කාර්ය සාධන සාරාංශය	128

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණය නීතිගත සංස්ථාව

1957 අංක 49 දරණ කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනතට අනුව මහා පරිමාණ සිවිල් ඉංජිනේරුමය කොන්ත්‍රාත්තු කටයුතු කිරීම සඳහා 1971 වර්ෂයේ දී රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පිහිටුවා තිබේ. සංස්ථාවේ එකම කොටස්කරු වශයෙන් කටයුතු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයයි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පාලම්, මහා මාර්ග, ජලාශ, වාරිමාර්ග පද්ධති, ජල විදුලි බලාගාර , උමං හා ඇල මාර්ග, ජල සැපයීම් ව්‍යාපෘති , ගොඩනැගිලි හා ඉදිකිරීම් ව්‍යාපෘති යන ඉංජිනේරුමය කාර්යයන්හි නිරතව සිටී.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පෙරසවී කොන්ක්‍රීට් නිප්පාදන අයිතම් වල සිට පෙර සවි කොන්ක්‍රීට් පාලම් කදම්භ, සම්ප්‍රේපණ කණු සහ දුම්රිය **කොන්ක්‍රීට් සිල්පර** දක්වා වන සියලුම කොන්ක්‍රීට් භාණ්ඩ නිප්පාදනයේ පුරෝගාමී ආයතනයකි.



ආයතනික තොරතුරු

- ආයතනයේ නම : රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

- ආයතනයේ නෛතික තත්ත්වය : රාජ්‍ය සංස්ථා

- සංස්ථාපන පනත :1971.03.29 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍ර අංක 14.951/4
- පාලනය :1957 අංක:49 දරණ කාර්මික ආඥා පනත යටතේ

- සංස්ථාපනය කරන ලද දිනය : 1971.10.01

- ලියාපදිංචි කාර්යාලය : අංක:7, බොරුපන පාර, රත්මලාන.
  දූ.ක. 0112-607560

- කොන්ක්‍රීට් අංගන :
  i. රත්මලාන කොන්ක්‍රීට් අංගනය
  දූ.ක. 0112-632786

  ii. බෝපිටිය කොන්ක්‍රීට් අංගනය,පන්නල
  දූ.ක. 037-2288415

  iii. වේරගංතොට කොන්ක්‍රීට් අංගනය
  දූ.ක. 055-2257101

  iv මැදවච්චිය කොන්ක්‍රීට් අංගනය
  දූ.ක. 081-2387056

  v. ලුණුගම්වෙහෙර කොන්ක්‍රීට් අංගනය
  දූ.ක. 047-3144880

- සංචාරක බංගලා i.පේරාදෙණිය
  දූ.ක. 081-2387056 0112-607560
  ii.මැදවච්චිය
  දූ.ක. 025-3899916

- විගණක : විගණකාධිපති දෙපාර්තමේන්තුව

- බැංකුකරුවෝ : ලංකා බැංකුව
  මහජන බැංකුව

ආයතනයේ ඉදිරි දැක්ම, ගමන් මග හා අරමුණු

ඉදිරි දැක්ම

"ජාතික ආර්ථිකයට වටිනාකම් එකතු කරන යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු හොඳම ආයතනය වීම."

ඉදිරි ගමන් මග

ජාතික යටිතල පහසුකම් සංවර්ධනය හා විවිධ ඉදිකිරීම් කටයුතු වලට සහභාගී වීම හා එම කටයුතු ඉහළම තත්ත්වයෙන් කර ගෙන යෑමත් මගින් රටේ ආර්ථික සංවර්ධනයට උදව් කිරීම හා සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් හා පෙරසවි කොන්ක්‍රීට් භාණ්ඩ නිපදන ක්ෂේත්‍ර වල වෙළඳ පොළ පෙර ගමන්කරු වීම.

අරමුණු

- ලංකාව තුල හෝ විදේශයකදී ඕනෑම පාර්ශවයකට අයිති ගොඩනැගිලි සිවිල් ඉංජිනේරුමය කාර්යයන්, අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති හෝ අනෙකුත් ව්‍යාපාර තනිව හෝ අනෙකුත් දේශීය සමාගමක් සමග එක්ව හෝ වෙනත් විදේශිය සමාගමක් සමග එක්ව හෝ අනෙකුත් එවැනි ආයතනයක් පවරා ගැනීමෙන් හෝ කොටස් ලබා ගැනීමෙන් විමර්ශනය, ආයෝජනය, සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම..

- ඉහත සඳහන් ව්‍යාපෘති කාර්යයන් ශ්‍රී ලංකාව තුල හෝ විදේශයකදී ක්‍රියාත්මක කිරීම හෝ අධීක්ෂණය කිරීම සඳහා තනිව හෝ අනෙකුත් දේශීය හෝ විදේශීය සමාගමක් සමග එකතුව හෝ එවැනි සමාගමක් පවරා ගැනීමෙන් හෝ කොටස් අත්පත් කර ගැනීම තුලින් කටයුතු කිරීම

- ඉහත සඳහන් කරුණු 01 හෝ 02 අවශ්‍ය කරන යාන්ත්‍රික හා විද්‍යුත් කාර්යයන් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හෝ තැනීම් කිරීම.

- ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය කොන්ක්‍රීට්, සවි ගැන්වූ හා පෙරසවි කොන්ක්‍රීට් දේශීයව හෝ විදේශීයව නිපදනය හා අලෙවි කිරීම.

- ඉංජිනේරුමය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය උකහා ගැනීම සහ ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර සහ අමු ද්‍රව්‍ය නිපදනය, අලෙවි කිරීම, ආනයනය සහ අපනයනය කිරීම.

- ඉහත සඳහන් අංක 1 2 3 හා 4 කාර්යයන් සඳහා අවශ්‍ය ඉදිකිරීමේ ද්‍රව්‍ය, ක්‍රම සහ උපයෝගි කරගන්නා තාක්ෂණය සම්බන්ධව පර්යේෂණ කිරීම.

- ඉහත අංක 1 2 3 හා 4 සඳහා අවශ්‍ය වන කළමණාකාරිත්ව දැනුම, කුසලතාවය හා නවීන තාක්ෂණික දැනුම යනාදිය කළමණාකරුවන්ට/ ඉංජිනේරුවන්ට/ තාක්ෂණික නිලධාරින්ට පුහුණු වීමේ අවස්ථා මගින් ලබාදීම.

- ශක්තිමත් ස්වයං මූල්‍ය හැකියාවක් ඇති ආයතනයක් වශයෙන් පවත්වා ගැනීම.

- ලාභදායි සහ ජව්‍ය ආයතනයක් වීම.

- ස්ථාවර පිරිවැටුම් වර්ධනයක් ලගා කර ගැනීම.

- අවදානම හඳුනා ගැනීම හා ක්‍රමානුකූලව කළමණාකරණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය


අධ්‍යක්ෂ මණ්ඩලය

- ඉංජි. එස්. එම්. කුශාන් දේවින්ද මහතා — සභාපති
- මහාචාර්ය ජී. බී. රංජිත් දිසානායක මහතා — අධ්‍යක්ෂ
- ආචාර්ය සුනිල් පී. ලියනාරච්චි මහතා — අධ්‍යක්ෂ
- කේ. කේ. චන්ද්‍රිකා මිය — අධ්‍යක්ෂ
- කුශාන් වැගොඩපොල මහතා — අධ්‍යක්ෂ
- දිනූශ කෝන්කඩුව මහතා — අධ්‍යක්ෂ
- ඩබ්. ජී. එන්. තුෂාරී මිය — භාණ්ඩාගාර නියෝජිත

ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය

- ඉංජි. ඩී. එස්. ඩී .ඩී .සී .රාජසිංහ මහතා — සාමාන්‍යාධිකාරී
- ඉංජි. ඩබ්. ජී. ඩී. ආර්.ශාන්ත කුමාර මහතා — නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉදිකිරිම්)
- ඉංජි. ඩී. ජී. පී. දමයන්ති මිය — නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රගති සමාලෝචන)
- ඉංජි. ඒ. ඩී. එන්. රංජිත් මහතා — වැ. බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (යාන්ත්‍රික)
- ඉංජි. යූ. ආර්. හේමජිත් මහතා — වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන හා සැලසුම්)
- ජයනි මායාදුන්නේ මෙනෙවිය — නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූදල්)

• සි. එන් බෝගහවත්ත මිය (එල්.එල්.බී.)	වැ. බ. ජ්‍යෙෂ්ඨ කළමණාකාර (මානව සම්පත් හා පරිපාලන)
• ආර් .ඒ. කේ. නිශාන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක
• අසංක මොහාන් මහතා	වැ.බ. සැපයුම් කළමණාකරු


SD&CC
ව්‍යාපෘති
2024
ඉදිකිරීම් ව්‍යාපෘති
ග්‍රාමීය පාලම ව්‍යාපෘතිය
1288
1278
1296
1420
1301
1300
1317/1318
1319/1320
1294
1327
1322
1373
1371
1321
1285
1418
1283
1373
1280
1299
1190
1289
1415
1416
1279
1372
1378
1379
1286
1172/1185
1333
1178
1381
1268
1186
1177
1178
1171
1207
1184
1163
1161
1179
1180
1188

ව්‍යාපෘති ලැයේස්තුව - 2024

1161 කිරිදි ඔය හරහා මෝදරපැලැස්ස පාලම
1163 වලවේ ගඟ හරහා තාලිගල සහ රිදියාගම පාලම
1171 කිරිදි ඔය හරහා උඩුවිල හා රබර්වත්ත පාලම
1172 උඉරුබොක්ක ඔය හරහා කෙසෙල්වත්ත කටුවාන පාලම
1174 රඹුක්වැව කොට්ඨාසයේ වැලිගත්තර හරහා පාලම
1175 මුවන්වැව සහ වීරවිල් ආර අතර වීරවිල් ආර හරහා පාලම
1176 අභයපුර කොට්ඨාසය සහ පන්නෙගමුව කොට්ඨාසය අතර දියබණ්ඩිය පාලම
1177 වලවේ ගඟ හරහා බැඳිගන්තොට හා ලියන්ගස්තොට පාලම
1178 මලලඇර රන්මදුවැව හරහා තණමල්විල පාර පාලම
1179 යාය වලස්මුල්ල පල්ලේකන්ද පාර පාලම
1180 උඉරුබොක්ක ඔය හරහා කුඹුක්මුල්ල මැදගොඩ පාලම
1181 තලුන්න අඳුපැලැන හරහා පාලම
1184 තරුණසේවා කිරම ඔය හරහා හඳුගල පාලම
1185 උඉරුබොක්ක ආය හරහා කම්මලේ තොටුපොල දක්වා පාලම ඉදිකිරීම
1190 හංවැල්ල පාලමේ අලුත්වැඩියා කටයුතු
1205 සූරියවැව රෝහල පිටුපස ඇළ හරහා පාලමක් ඉදිකිරීම.
1206 වලස්මුල්ල ජාතික පාසල සඳහා පදික පාලම
1207 වරාපිටිය දෙයියන්දර මාර්ගයේ පාතේගම දිඹුල්ගහඟේන දොළ හරහා පාලම
1268 අංක. 62/5 ගාල්ල - දෙනියාය - මාදම්පේ මාර්ගයේ පාලම ප්‍රතිසංස්කරණය කිරීම
1278 පරන්තන් –කරවිව් මුලතිව පාරේ අංක 12/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම
1279 හොරවල පාලම
1280 මැක්ඩොනල්ඩ්ස් අසල රාජගිරියේ පාලම 5/1
1283 අළුත් මාවත සි පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම
1285 මොරොන්තොට - අරන්දර මාර්ගය වැඩිදියුණු කිරීම
1286 ඇඹිලිපිටිය - පනාමුර - බුළුතොට පාර වැඩිදියුණු කිරීම
1287 කන්දෙවිහාර හන්දිය පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (අදියර 1/ අදියර 2)
1288 වේලනෙයි PS හි ග්‍රාමීය මාර්ග - යාපනය දිස්ත්‍රික්කය
1289 නාවල අංගම්පිටිය පාලම
1294 මහනුවර යාපනය පාරේ රැඳවුම් තාප්ප ඉදිකිරීම
1296 වැලිඔය සම්පත්නුවර මාර්ගය වැඩිදියුණු කිරීම
1299 ආරක්ශක මූලස්ථානයේ VVIP ප්‍රවේශ පාලම
1300 අනුරාධපුර ග්‍රාමීය මාර්ග (P22)
1301 අනුරාධපුර ග්‍රාමීය මාර්ග (P23)
1317 දඹුල්ල-බකමූණ-කලගහඟේන මාර්ගය
1318 දඹුල්ල-බකමූණ-කලගහඟේන මාර්ගය
1319 මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P26)
1320 මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P27)
1321 පන්සිල්ගොඩ පාලම
1322 රඹුක්කන මාර්ග ව්‍යාපෘතිය
1327 හුන්නස්ගිරිය මීමුරේ පාරේ හීන් ගඟ හරහා පාලම ඉදිකිරීම
1336 කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 4)
1338 නුවර එළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව 5)
1339 රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 8)
1340 නුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 9)
1341 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 8)
1342 පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 4)
1343 මොනරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 5)
1344 බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 6)
1347 කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 8)
1348 ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 13)
1349 කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 8)
1350 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 8)
1351 ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 6)
1352 මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 6)
1353 පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 5)
1354 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 16)
1355 අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 5)
1356 මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 3)
1357 යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 2)
1358 මන්නාරම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 1)
1359 මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 1)
1360 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 1)
1361 වවුනියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 2)
1365 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව 2)
1366 ඇබ්ලිපිටිය ජල ව්‍යාපෘතිය
1371 වරකාපොළ වයඩක්ට් අංක 01 ඉදිකිරීම
1372 ඉත්තැපාන හා හොරවල මාර්ගයන් සම්බන්ධ කරමින් බෙන්තර ගඟ හරහා ඉදිකරන පාලම
1373 ගැටඹේ, මහවැලි ගඟ දිගේ ගේබියන් තාප්පය ඉදිකිරීම
1374 තිස්සමහාරමජල සැපයුම් යෝජනා ක්‍රමයේ වැඩිදියුණු කිරීම් (අදියර II)
1378 පත්තිනිගොඩ පාලම
1381 මාඳු ගඟ පාලම
1391 කෙත්ගේන ජල ව්‍යාපෘතිය
1415 බම්බලපිටිය උඩු මාර්ග පාලම (Overpass)
1416 වැල්ලවත්ත උඩු මාර්ග පාලම (Overpass)
1418 පොතුවිල් උප ඩිපෝව
1420 මැදවච්චිය ටයර් කර්මාන්ත ශාලාව

නාවල-අංගම්පිටිය පාලම ඉදිකිරීම







ආයතනික පාලනය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ අරමුණු තීරණය කිරීමත් එකී අරමුණු ලඟා කර ගන්නා අයුරින් ආයතනයේ මෙහෙයුම් කර ගෙන යාමත් සහ කාර්යය සාධනය සොයා බැලීමත් ආයතනික පාලනය යන්නෙන් අදහස් කෙරේ.එම නිසා ව්‍යාපෘති අවදානම් ඵලදායි ලෙස හඳුනාගැනීමත් ඒවා පාලනය කිරීමත්, කළමනාකරණය කිරීමත් ආයතනික පාලනය තුළින් බලාපොරොත්තු වේ.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව සම්පූර්ණයෙන් රාජ්‍ය හිමිකාරිත්වය යටතේ ඇති ආයතනයක් වන අතර, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ආමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය යටතේ ක්‍රියාත්මක වෙයි. අමාත්‍යාංශය හරහා අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකීමට බැඳී සිටී. එම නිසා ආයතනය පාලනය කරනු ලබන්නේ සහ මෙහෙයවනු ලබන්නේ සංස්ථාවේ සහ එයට සම්බන්ධ වන පාර්ශවයන්ගේ යහපත පිණිස වන බවට සහ එය පාලනය වන නීතිරීති වලට අනුකූලව ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය බැඳී සිටී.

ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පාලනය පාර්ලිමේන්තුව සතු වේ. එම නිසා රාජ්‍ය ව්‍යවසාය පාර්ලිමේන්තුව පාලනයට යටත් වේ. අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධව තීරණ ගැනීමේ වගකීමට බැඳී සිටී. රාජ්‍ය සංස්ථාවල මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වගකීමට බැඳී සිටී. මේ සඳහා මහා භාණ්ඩාගාරය විසින් අධ්‍යක්ප මණ්ඩලය, ආර්ථික කාර්යක්ෂමතාවය සහ ඵලදායිත්වය ඇතිකර ගැනීම සඳහා වන මවුනගේ වගකීම ඉටු කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍යය රෙගුලාසි, නීතිරීති, නියමයන්, මග පෙන්වීම් සහ නියෝග චක්‍රලේඛ මගින් ලබාදෙනු ලබයි.

භාණ්ඩාගාර නියෝජිත වශයෙන් කටයුතු කරනු ලබන අධ්‍යක්ෂ හැර අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් විපයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරනු ලබයි. කොටස් හිමිකාරිත්වය දරණ මහා භාණ්ඩාගාරය විසින් එක් අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබයි.

සංස්ථාවේ ලැදියාවත් සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ පුද්ගලික ලැදියාවන් අතරේ එකිනෙක ගැටෙන තත්ත්වයන් නොමැති අතර, සංස්ථාවේ ක්‍රියාකාරකම් පවත්වාගෙන යනු ලබන්නේ. ඉදිකිරීම් තුල වඩා හොඳ මූල්‍යමය සහ මෙහෙයුම් ශක්තියෙන් යුතු ආයතනයක් බවට පත්කිරීමටය. ආයතනික යහපාලනය උදෙසා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව විසින් ගෙන ඇති පියවරයන් පහත දැක්වේ.

ආයතනික යහපාලනය

යහපාලන මූලධර්ම	**පවත්වාගෙන යාමේ ක්‍රමවේදය**
අධ්‍යක්ෂ මණ්ඩලය	
අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය	අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂ වරයෙකුගෙන්ද. විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකුගෙන්ද සමන්විතය. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු පත්කරනු ලබන්නේ මහාභාණ්ඩාගාරය විසිනි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ අවශ්‍යතාවයට අනුව සහ මෙහෙයුම් කටයුතු වලට අවශ්‍ය වන පරිදි ප්‍රමාණවත් මග පෙන්වීමක් කළ හැකි විශේෂ හා විවිධ හැකියාවන්ගෙන් යුතු කණ්ඩායමකින් සමන්විතය.
ක්‍රමානුකූලව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.	විශේෂ අවස්ථාවන්හි පැවැත්විය යුතු රැස්වීම් වලට අමතරව සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ක්‍රමානුකූලව පවත්වනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීමට අයත්වන විධිමත් කාරණා ලැයිස්තුවක් පවත්වා ගැනීම.	**<u>අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වගකීමට බැඳේ</u>** • රේඛීය අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් හැටියට සංස්ථාවේ සාර්ථක කාර්ය සාධනයක් සහතික කිරීම. • ප්‍රතිපත්ති. ක්‍රමවේදයන් සැකසීම සහ ඒවා සාර්ථකව ක්‍රියාත්මක කරනවාද යන්න අධීක්ෂණය කිරීම. • සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමණාකරන නිලධාරීන් පත්කිරීම. ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන්ගේ කාර්යය සැළසුම් කිරීම සහ ආයතනයේ ව්‍යුහය අනුමත කිරීම. • ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සහතික කිරීම. • උසස් නෛතික ප්‍රමිතියක් පවත්වාගෙන යාම සහතික කිරීම මේ යටතේ භාණ්ඩාගාර චක්‍රලේඛණ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ආමාත්‍යාංශයේ මගපෙන්වීම් පිළිපැදීම පිළිබඳව සලකා බැලේ. • සභාපතිගේ සහ සාමාන්‍යාධිකාරිගේ පාලනය යටත් නොවන ගෙවීම් වන වාර්ෂික ප්‍රසාද දීමනා. නිවාඩු පඩි ගෙවීම් යනාදිය අනුමත කිරීම. • දේපළ පිරියත සහ උපකරණ වල ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජන තීරණය කිරීම. • වාර්ෂික අයවැය සහ සංයුක්ත සැලැස්ම අනුමත

	කිරීම. • ප්‍රසිද්ධ කිරීම සඳහා වන වාර්ෂික ගිණුම් වාර්තා අනුමත කිරීම.
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	සංස්ථාවට ස්ථීර ලේකම්වරයෙක් නොමැත. නීති නිලධරයා මණ්ඩල ලේකම් ලෙස කටයුතු කරයි. අදාළ මණ්ඩල පත්‍රිකා සහිත සියලුම මණ්ඩල රැස්වීම්වල ලිපිගොනු සභාපතිවරයාගේ අනුමැතිය ඇතිව කල්තියා බෙදා හැරීමට ඇය කටයුතු කරයි. රැස්වීම් වාර්තා අත්සන් කරන සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ ඇය සියැම ක්‍රියාදාමයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා සකස් කරනු ලබයි.
ස්වාධීනව තීරණ ගැනීම සහ වඩාත් සුදුසු ක්‍රම වේදය	කළමණාකරන මණ්ඩලය විසින් වටිනාකම් එකතු කරමින්ද. ස්වාධීන තීරණ ගනිමින්ද. රා.සං.භා.නි.නී. සංස්ථාවේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගිවේ. එමෙන්ම, බාහිර බලපෑම් වලින් සහ පාලනයන්ගෙන් තොරව ඔවුන්ගේ වගකීම් ඉටුකිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටුයතු කරයි.
සංස්ථාවේ සහ මණ්ඩලයේ කාරනා සම්බන්ධයෙන් සාධාරණව කාලය සහ ශ්‍රමය වෙන්කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මණ්ඩලයේ සහ සංස්ථාවේ ගැටළු සම්බන්ධයෙන් සාධාරණ කාලයක් වෙන් කරනු ලබයි. ඊට අමතරව මාසිකව පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වීම සහ විගණන සහ කළමණාකරන කමිටු රැස්වීම් වල සාකච්ජා කරනු ලබන කාරණා සම්බන්ධයෙන් දන්වා යැවීම.
අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම.	සියළුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය ඇතුව සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංස්ථාව පාලනය කරනු ලබයි.
අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය	අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයක් විධායක නොවන ස්වාධීන අයවේ. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිවරයෙක්ද, නීතිඥවරයෙක්, ඉංජිනේරුවරු දෙදෙනෙක් සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරයාගෙන්ද සමන්විත වේ. කළමණාකරනයේ සාමූහික දැනුම සහ පළපුරුද්ද සංස්ථාවේ අවශ්‍යතාවය හා සැසඳෙන බව මණ්ඩලය විශ්වාස කරයි.
කළමණාකරන තොරතුරු ප්‍රමානවත්ව සහ කාලීනව ලබා ගැනීම.	සංවිධානය කරන ලද කළමණාකරන තොරතුරු පද්ධතියක් පැවතීම අධ්‍යක්ෂ මණ්ඩලයට නිවැරදි සහ අදාල තොරතුරු අවශ්‍ය පරිදි ලබාදීම. යම් අවස්ථාවක ඔවුන්ට ලැබෙන තොරතුරු තීරණ ගැනීම සඳහා ප්‍රමාණවත් නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් ඔවුන් විසින් අමතර තොරතුරු කැඳවනු ලබන අතර, ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයද දැනුවත් කරනු ලබයි.
ශක්තිමත්, ස්වාධීන විධායක නොවන පුද්ගලයන්ගෙන් මණ්ඩලය සමන්විත වීම.	අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරයක් විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ..

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය්‍ය සාධනය මැන බැලීම.	මණ්ඩලය කටයුතු කරනු ලබන ආකාරය පිළිබඳව මැන බැලීමට විශේෂිත වූ ක්‍රම වේදයක් නොමැත. එමනිසා අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලයේ මූලික ක්‍රියා පටිපාටි මැන බැලීමට ස්ව අගය කිරීමක් ක්‍රියාත්මක කරනු ලබයි. එහිදි පහත දැක්වෙන ක්‍රියාකාරකම් පිලිබඳව සලකා බලනු ලබයි. • ව්‍යවස්ථාපිත රෙගුලාසි වලින් පනවා ඇති වගකීම් සහ මණ්ඩලයට ඇති වගකීම් ඉටුකිරීම. • ආයතනික පාලනය සහ කළමණාකරනය අධික්ෂණය. • වාර්ෂික තිරණ ගැනීම සඳහා තම මතය ලබාදීම • අමාත්‍යාංශය යටතේ අඛණ්ඩව ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. • ඉංජිනේරුවන්. තාක්ෂණික ශිල්පින්. ගණකාධිකාරිවරුන් සහ අනෙකුත් පුහුණු සේවකයන් සම්බන්ධයෙන් ඇති වන පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් සැලැස්ම නිර්මාණය කිරීම. • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාරය කළමණාකරනය කිරීම සම්බන්ධයෙන් දරන පොදු මතය
සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය පිළිබඳව	සංස්ථාවේ පරමාර්ථ සහ අරමුණු වලට අදාලව මණ්ඩලය විසින් සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ සේවක මණ්ඩලය වෙනුවෙන් මූල්‍ය සහ මූල්‍ය නොවන අරමුණු දක්වනු ලැබේ.
	සංස්ථාවේ ආයතනික සැලැස්ම සහ අයවැය තුල දක්වා ඇති ප්‍රධාන ආයතනික අරමුණු සහ පරමාර්ථ සාමාන්‍යාධිකාරි සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරන මණ්ඩලයේ අරමුණු ලෙස සැලකෙන අතර. ඔවුන්ගේ කාර්ය්‍ය සාධනය මැන බලනු ලබන්නේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. සංස්ථාවේ මෙහෙයුම් කළමණාකරනය සාමාන්‍යාධිකාරි වෙත පවරා ඇත.
ප්‍රධාන ගනුදෙනු	
ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් හෙළිදරව් කිරීම.	ප්‍රධාන ගනුදෙනු සහ සංස්ථාවේ ඒකාබද්ධ ශුද්ධ වත්කම් කෙරෙහි ඒවායේ බලපෑම් අවශ්‍යය නැත්නිදි හෙළිදරව් කරඇත.
ගිණුම්තැබීම සහ විගණනය	
මූල්‍ය වාර්තාකරනය	
සංස්ථාවේ වර්තමාන තත්ත්වය සහ ඉදිරිය පිළිබඳව හෙළිදරව් කිරීම.	සංස්ථාවේ කටයුතු පිළිබඳව සාධාරණ ආගනනය කිරීමක් සඳහා කාර්තු වාර්තා ඔවුන් විසින් දෙනු ලැබූ විශේෂිත ආකෘති කිහිපයකට අනුව පිළියෙල කොට කාලිනව මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරනු ලබයි. මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජාත්‍යන්තර ගිණුම් ප්‍රමිති පදනම් කරගෙන සකසා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතයන් අනුවය. එමනිසා

	සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණවත් අයුරින් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිත හා එකඟ වේ.
වාර්ෂික වර්තාව තුළ සභාපතිගේ ප්‍රකාශන ඇතුලත් කිරීම.	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක **04** සභාපතිගේ වාර්තාව දක්වා ඇත.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් ඇතුලත් ප්‍රකාශයක් හා ඔවුන්ගේ වාර්තා කිරීමේ වගකීම් දැක්වෙන විගණකාධිපතිගේ ප්‍රකාශය	මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක **29** යටතේ මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සම්බන්ධව ප්‍රකාශයක්ද පිටු අංක **30** සිට **39** දක්වා **2023** දෙසැම්බර් **31** න් අවසන් වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය සම්බන්ධ විගණකාධිපතිගේ වාර්තාවද ඇතුලත් වේ.
අභ්‍යන්තර පාලනය	
මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු වල අනුකූලතාවය සහ සංස්ථාවේ වත්කම් ආරක්ෂා වන ආකාරයේ අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාම.	කළමණාකාරිත්වය විසින් ඵලදායක අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කර ඇති බව හා ඒ තුළින් නෛතික මූල්‍ය නීති, අමාත්‍යාංශ සහ භාණ්ඩාගාරයේ මගපෙන්වීම් සහ අනෙකුත් නීති රෙගුලාසි හා එකඟ වන බවටත් සහතික වීම.
මගපෙන්වීම.	• අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල නිලධාරින්ට දන්වා සිටීම සහ පෙරලා එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම. • මෙහෙයුම් මූල්‍ය සහ සේවකයන් සම්බන්ධව

	කාරනා සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා සිටිය යුතු කාරනා සම්බන්ධව සාකච්ඡා කරන ජ්‍යෙෂ්ඨ සේවක රැස්වීම් මසකට වරක් පවත්වනු ලබන්නේ සියලුම අංශ ප්‍රධානීන් හා ප්‍රධාන ඉංජිනේරුවන් සහභාගීත්වයෙනි. • ඉදිකිරීම් අංශය සහ කොන්ක්‍රීට් අංගන සඳහා සෑම මසකම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලබයි. මේ සඳහා සියලුම ව්‍යාපෘති සහ අංගන කළමණාකරුවන් සහභාගි වන අතර, අවසානයේ ඒ පිලිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයටද වාර්තා කරනු ලබයි.
විගණන කමිටු සහ විගණකවරු	
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විගණන කමිටුව සහ ඒ පිළිබඳව වාර්ෂික වාර්තාවේ ඇතුලත් වාර්තාව	විගණන කමිටුවේ මූලසුන දරනුයේ අධ්‍යක්ෂ මෙන්ම භාණ්ඩාගාරයේ නියෝජිතවරයා විසිනි. අනෙකුත් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු මෙම කමිටුවට ඇතුලත් වේ.. විගණකාධිපති දෙපාර්තුමේන්තුවේ නියෝජිතයා සහ අමාත්‍යාංශ නියෝජිතයා මේ සඳහා සහභාගි වනු ලබන්නනේ ආරාධනාව මතයි.
විපය මූලික බව සහ ස්වාධීනත්වය සහතික විම පිණිස බාහිර විගණකයන් සමග යෝග්‍ය අයුරින් සම්බන්ධතා ගොඩනගා ගෙන පවත්වාගෙන යනු ලබයි.	රා.සං.හා.නි.නී. සංස්ථාව විසින් විගණකයන්, විගණකාධිපති දෙපාර්තමෙන්තුව සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගෙනයනු ලබයි.
පරීක්ෂණ මණ්ඩලය	**2024.12.31** දිනට දේපල, යන්ත්‍ර සහ උපකරණ ආගණනය කර ඇත.
ආයතනික පාලනය හෙලිදරව් කිරීම.	
සංස්ථාව තුල පනවා ඇති ආයතනික පාලනය හෙලිදරව් කිරීම.	ආයතනික යහ පාලනය සහ එය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන මගපෙන්වීම් අනුව කාර්‍යක්ෂම ක්‍රියාපටිපාටි හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම තුලින් යහ පාලනය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනුලබයි. මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද සිද්ධාන්ත සහ ක්‍රියාවන් දැනටමත් සංස්ථාව තුල ක්‍රියාත්මක වන බව සටහන් කිරීමට කැමැත්තෙමි. දැනට සංස්ථාව තුල ක්‍රියාත්මක නොවන පරිචයක් අතලොස්සක් සඳහා ඒවා නිවැරදි කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබේ. එමෙන්ම යහ පාලනය සම්බන්ධයෙන් ඇති යෝජනා සහ මග පෙන්වීම් තුලින් සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල මෙහෙයුම් ආකෘතිය සහ නීති පරිසරය වැඩි දියුණු කරනු ලබන බවට විශ්වාස කෙරේ.

කෙත්හේන ව්‍යාපෘතිය









2024 වසර තුළ කාර්ය සාධනය

දළ විශ්ලේෂණය

රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව ස්වයං මූල්‍ය රාජ්‍ය ව්‍යවසායයක් වන අතර එහි ප්‍රධාන ආදායම ජනනය වන්නේ සිවිල් ඉංජිනේරු කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමෙනි. ඊට අමතරව පෙර වාත්තු කොන්ක්‍රීට් නිෂ්පාදන සහ ජාතික මාර්ග ජාලයේ රථවාහන ආලෝක සංඥා පද්ධති ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම වැනි විද්‍යුත් යාන්ත්‍රික සම්බන්ධතා ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ආදායම සංස්ථාවේ මුළු ආදායමට දායක වේ.

2024 දී රජයේ විශේෂ කැබිනට් තීරණයකින් පසුව සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් තීරණයේ ප්‍රතිඵලයක් ලෙස සේවක සංඛ්‍යාව අඩු කරන ලදී. නව ව්‍යාපෘති භාර නොගන්නා ලදී. ව්‍යාපෘති අත්හිටුවීම හේතුවෙන් ආයතනයේ ආදායම සැලකිය යුතු ලෙස අඩු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් සෘණ පිරිවැටුමක් ඇති විය.

2024 දී රුපියල් මිලියන 2235.26 ක මුළු පිරිවැටුමක් අපේක්ෂා කළ නමුත් රුපියල් මිලියන **430** ක් පමණක් ලබා ගැනීමට සමත් විය.

ඉදිකිරීම් ව්‍යාපෘති


2024 දී ඉදිකිරීම් ව්‍යාපෘති වලින් පමණක් රුපියල් මිලියන 818.26 ක පිරිවැටුමක් අපේක්ෂා කළ නමුත් රුපියල් මිලියන 70.42 ක සෘණ පිරිවැටුමක් අත්කර ගෙන ඇත. මෙම සෘණ පිරිවැටුම නවතා දැමූ ඉදිකිරීම් ව්‍යාපෘතිවල ආදායම අඩුවීම සහ වැටුප්, LD වැනි දඩ මුදල් සහ අනෙකුත් සම්පත් වියදම් සඳහා වන වියදම්වල සෘජු ප්‍රතිඵලයකි.

2024 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති

2024 **දී** සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සංඛ්‍යාව සැලකිය යුතු ලෙස සීමිත විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ ව්‍යාපෘති කිහිපයක් අත්හිටුවීම සහ සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් තීරණයයි. එහි ප්‍රතිඵලයක් ලෙස වසර තුළ ක්‍රියාත්මක වූයේ ව්‍යාපෘති කිහිපයක් පමණි.

2024 වර්ෂයේ සිදු කළ ප්‍රධාන ඉදිකිරීම් ක්‍රියාකාරකම් පෙර වර්ෂවල ආරම්භ කළ ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා සීමිත ප්‍රගතියක් ලබා ගැනීම වෙතම සීමා විය.

ඒ අනුව, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ මෙම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය පහත පරිදි සාරාංශ ගත කර ඇත.



කොන්ක්‍රීට් අංගන

2024 දී කොන්ක්‍රීට් නිෂ්පාදන වලින් රුපියල් මිලියන 130.60 ක පිරිවැටුමක් සැලසුම් කර ඇති අතර එය රුපියල් මිලියන 110.05 ක වර්ධනයක් අත්කර ගෙන ඇත. ද්‍රව්‍ය සඳහා ප්‍රමාද වූ අරමුදල් ශ්‍රම බලකායේ හිඟය සහ වයස්ගත වන යන්ත්‍රෝපකරණ නිතර බිඳවැටීම් හේතුවෙන් සාමූහිකව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු නිෂ්පාදනයක් ඇති විය.

යාන්ත්‍රික සේවා

2024 දී SD&CC යාන්ත්‍රික සේවා වලින් රු. මිලියන 250ක පිරිවැටුමක් අත්කර ගෙන ඇති අතර, එහි පිරිවැටුමෙන් වැඩි ප්‍රමාණයක් රථවාහන ආලෝක සංඥා පද්ධති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ආදායමෙන් සමන්විත වේ. ආර්ථික අර්බුදය තිබියදීත්, යාන්ත්‍රික සේවා වලින් ලැබෙන ආදායම සංස්ථාවට යම් ධනාත්මක දායකත්වයක් ලබා දෙමින් ස්ථාවරව පවතී.


මූල්‍ය සමාලෝචනය

මෙම වාර්ෂික වාර්තාවේ කොටසක් වන සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය දක්වා ඇත.


සංස්ථාවේ ක්‍රියාකාරිත්වය

2023 වසරේ රු. මිලියන 219ක් ලෙස වාර්තා වූ ආදායමට සාපේක්ෂව, 2024 වසරේ සංස්ථාව රු. මිලියන 430ක ව්‍යාපාර ආදායමක් වාර්තා කර ඇත. මෙම ආදායම් වර්ධනයට ප්‍රධාන වශයෙන් මාර්ග සංඥ පද්ධති අංශය විසින් රු. මිලියන 250ක ධනාත්මක ආදායමක් වාර්තා කිරීම බලපා ඇත. 2023 වසරේ ආර්ථික අර්බුදය හේතුවෙන් රු. මිලියන 299ක ඍණ ආදායමක් වාර්තා කළ නිර්මාණ අංශය, 2024 වසරේදී රු. මිලියන 70ක ධනාත්මක ආදායමක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සමස්ත ආදායම වැඩිවීමට සැලකිය යුතු ලෙස දායක වී ඇත. තවද, 2023 වසරේ රු. මිලියන 2,246ක ශුද්ධ අලාභයක් වාර්තා කළ සංස්ථාව, 2024 වසරේදී රු. මිලියන 1,411ක ශුද්ධ අලාභයක් ලෙස සම්පූර්ණ සංස්ථා මට්ටමින් වාර්තා කර ඇත.

පිටිවැටුම් දළ ලාභය සහ ශුද්ධ ලාභය පිළිබඳ විශ්ලේෂණය




ආංශික කාර්ය සාධනය



ඉදිකිරීම් අංශය

ඉදිකිරීම් අංශය විසින් වැඩසටහන්, සම්පත් කාලසටහන්ගත කිරීම, බිල්පත් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා දැඩි කාලසීමාවන් සහ සහතික කිරීම හරහා ඉදිකිරීම් ව්‍යාපෘතිවල කාර්ය සාධනය සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

ඉදිකිරීම් පිරිවැටුම සහ දළ ලාභය



පෙර වසරේ රුපියල් මිලියන 299 ක සෘණ ආදායමට සාපේක්ෂව, 2024 වර්ෂය සඳහා ඉදිකිරීම් ආදායම රුපියල් මිලියන 70 ක ධනාත්මක ශුද්ධ ආදායමක් වාර්තා කළේය.

ආර්ථික අර්බුදයේ බලපෑම ලිහිල් කිරීම සඳහා, සංස්ථාවේ ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ රජයේ තීරණයට අනුකූලව, 2024 වර්ෂයේදී සංශෝධනය කරන ලදී. මෙම සංශෝධිත ව්‍යාපෘති රුපියල් මිලියන 200 ක සෘණ ආදායමක් වාර්තා කළ අතර ඉදිකිරීම් අංශවල ශුද්ධ ආදායම රුපියල් මිලියන 70 දක්වා පහත වැටීමට හේතු විය.


ඉහත පාලනය කළ නොහැකි හේතුවේ ප්‍රතිවිපාකය තිබියදීත්, ඉදිකිරීම් අංශය 2024 දී සංස්ථාවේ පිරිවැටුමට 16% ක දායකත්වයක් ලබා දෙමින් ධනාත්මකව දායක වී ඇත.

කොන්ක්‍රීට් අංගන

SD&CC විසින් රත්මලාන, බෝපිටිය, වේරගංතොට, මැදවච්චිය සහ ලුණුගම්වෙහෙර යන ස්ථානවල කොන්ක්‍රීට් අංගන 05ක් සහ පේරාදෙණියේ අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන අතර ඉදිකිරීම් ව්‍යාපෘති වලින් ලැබෙන දැඩි අභ්‍යන්තර ඉල්ලුම සපුරාලයි. කොන්ක්‍රීට් අංගන, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ අනෙකුත් පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවන් වැනි බාහිර සේවාදායකයින්ගේ ඉල්ලුම සපුරාලයි. PSC බාල්ක, සම්ප්‍රේෂණ කණු, RCC පයිප්ප, පාලම් සංරචක සහ පදික වේදිකා සහ ගල්, කුහර කුට්ටි වැනි විවිධ නිෂ්පාදන නිෂ්පාදනය කරයි.

සමාලෝචනයට ලක්වන වර්ෂය තුළ කොන්ක්‍රීට් අංගන වලින් ලැබුණු පිරිවැටුම පෙර වසරේ පිරිවැටුම වූ රුපියල් මිලියන 268 ට සාපේක්ෂව රුපියල් මිලියන 110 ක් වූ අතර එය සංස්ථාවේ මුළු පිරිවැටුමෙන් 26% කට දායක විය. මෙම අංශය 2024 දී රුපියල් මිලියන 84 ක දළ පාඩුවක් සිදු කර ඇත.

කොන්ක්‍රීට් අංගන පිරිවැටුම සහ දළ ලාභය




මාර්ග සංඥා පද්ධති හා යාන්ත්‍රික සේවා

යාන්ත්‍රික අංශය රථවාහන ආලෝක සංඥා පද්ධති සහ වැඩ සේවා සමීපව අධීක්ෂණය කරයි. මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ සංස්ථාවේ පවතින ව්‍යාපෘති සඳහා සේවා සැපයීමයි. ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය සඳහා රථවාහන ආලෝක පද්ධති ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා රථවාහන ආලෝක පද්ධති (TLS) **ඒකකය** *2005* වර්ෂයේදී ස්ථාපිත කරන ලදී.

TLS සහ යාන්ත්‍රික සේවා වලින් ලැබුණු පිරිවැටුම රු. මිලියන *250* ක් වූ අතර එය පෙර වසරේ පිරිවැටුම රු. මිලියන *249* ක් විය. *2024* වර්ෂයේදී සංස්ථාවේ පිරිවැටුම සඳහා *TLS* සහ යාන්ත්‍රික සේවාවන්හි දායකත්වය *58%* කි. *2024* වර්ෂය සඳහා මෙම අංශය රු. මිලියන *133* ක දළ ලාභයක් උපයා ඇත.

මාර්ග සංඥා පද්ධති හා යාන්ත්‍රික සේවා පිරිවැටුම සහ දළ ලාභය



දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ සාරාංශය

2024 දෙසැම්බර් 31 දිනට

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
හම්බන්තොට පාලම්						
1	1161	කිරිදි ඔය හරහා මෝදරපැලැස්ස පාලම	RDA	205.20	138.22	75%
2	1163	වලවේ ගඟ හරහා තාලිගල සහ රිදියාගම පාලම	RDA	235.61	144.28	75%
3	1171	කිරිදි ඔය හරහා උඩුවිල හා රබර්වත්ත පාලම	RDA	163.69	103.11	96%
4	1172	ඌරුබොක්ක ඔය හරහා කෙසෙල්වත්ත කටුවන පාලම	RDA	55.49	15.88	40%
5	1177	වලවේ ගඟ හරහා බැඳිගන්තොට හා ලියන්ගස්තොට පාලම	RDA	245.71	62.95	37%
6	1178	මලලඇර රන්මදුවැව හරහා තණමල්විල පාර පාලම	RDA	90.19	39.65	58%
7	1179	යාය වලස්මුල්ල පල්ලේකන්ද පාර පාලම	RDA	83.76	22.17	59%
8	1180	ඌරුබොක්ක ඔය හරහා කුඹුක්මුල්ල මැදගොඩ පාලම	RDA	93.94	72.13	77%
9	1181	තලුන්න අදුපැලැන හරහා පාලම	RDA	93.04	27.04	38%
10	1184	තරුණසේවා කීරම ඔය හරහා හඳුගල පාලම	RDA	35.76	29.73	73%
11	1185	ඌරුබොක්ක ඔය හරහා කම්මලේ තොටුපල පාලම	RDA	43.98	34.06	84%
12	1186	කොහොම්පෝරුව සහ සියඹලාමුරය අතර තුන්දොල හරහා පාලම	RDA	39.76	39.99	97%
13	1188	කීරම ඔය හරහා අහුල්මඩුව අරංවෙල පාර	RDA	97.63	44.63	22%
14	1205	සූරියවැව රෝහල පිටුපස ඇළ හරහා පාලමක් ඉදිකිරීම.	RDA	28.77	19.40	96%
15	1206	වලස්මුල්ල ජාතික පාසල සඳහා පදික පාලම	RDA	22.03	2.53	15%
16	1207	වරාපිටිය දෙයියන්දර මාර්ගයේ පාතේගම දිඹුල්ගහහේන දොළ හරහා පාලම	RDA	38.09	11.52	50%

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
අනෙකුත් පාලම්						
1	1190	හංවැල්ල - පූගොඩ පාරේ පාලම් අංක 1/1 අලුත්වැඩියාව	RDA	112.94	27.53	22%
2	1278	පරන්තන් –කරච්චි මුලතිව පාරේ අංක 12/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීම	RDA	109.83	38.93	53%
3	1279	හොරවල පාලම	RDA	58.14	33.25	70%
4	1280	මැක්ඩොනල්ඩස් අසල රාජගිරියේ පාලම 5/1	RDA	93.17	46.21	52%
5	1299	ආරක්ශක මූලස්ථානයේ VVIP ප්‍රවේශ පාලම	RDA	409.66	191.60	76%
6	1289	නාවල පාලම	RDA	1,698.55	1,727.70	89%
7	1321	පන්සිල්ගොඩ පාලම	SMRR	70.34	22.45	44%
8	1327	හුන්නස්ගිරිය මීමුරේ පාරේ හීන් ගඟ හරහා පාලම ඉදිකිරීම	SMRR	61.01	15.15	34%
9	1371	අංක 01 වරකාපොල අතුරු පාලම ඉදිකිරීම	RDA	357.87	58.76	36%
10	1372	ඉත්තපාන සහ හොරවල පාර සම්බන්ධ කරමින් බෙන්තර ගඟ හරහා පාලම	RDA	484.18	36.97	6%
11	1374	පත්තිනිගොඩ පාලම	SMRR	61.39	2.84	5%
12	1381	මාදු ගඟ හරහා පාලම	RDA	780.75	39.70	7%
13	1415	බම්බලපිටිය දුම්රිය මගී පාලම	RDA		11.1	68%
14	1416	වැල්ලවත්ත දුම්රිය මගී පාලම	RDA		8.8	9%

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
මහාමාර්ග						
1	1283	අළුත් මාවත ඉහළ ශාන්ත ඇන්ඩෲස් පාර සිට දුම්කොළ සමාගම දක්වා පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම	RDA	159.40	49.41	74%
2	1284	වත්තල - හේකිත්ත මාර්ගය වැඩිදියුණු කිරීම	RDA	189.94	115.92	87%
3	1288	යාපනය දිස්ත්‍රික්කයේ වේලනයි ප්‍රාදේශීය සභාවේ මාර්ග වැඩිදියුණු කිරීම	RDA	112.83	66.71	83%
4	1294	මහනුවර/යාපනය පාර රැඳවුම් තාප්ප ඉදිකිරීම	RDA	49.55	11.33	32%
5	1296	වැලිඔය සම්පත් නුවර සිට ගජබාපුර පාර	RDA	56.00	13.18	38%
100,000 km **මහාමාර්ග ව්‍යාපෘතිය**						
1	1286	ඇඹිලිපිටිය - පනාමුර - බුළුතොට පාර වැඩිදියුණු කිරීම	RDA	177.41	107.09	79%
2	1287	කන්දෙවිහාර හන්දිය පුනරුත්ථාපනය/ වැඩිදියුණු කිරීම (අදියර 1/ අදියර 2)	RDA	206.87	86.19	61%
3	1300	තලවැව හන්දිය සිට වරාපොතාන පාර (P-22)	RDA	211.29	83.51	67%
4	1301	විලච්චිය පාර (P-23) පුනරුත්ථාපන/වැඩිදියුණු කිරීම්	RDA	180.39	65.36	56%
5	1317	දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම	RDA	186.62	47.79	29%
6	1318	දඹුල්ල-බකමූණ-කලගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය/වැඩිදියුණු කිරීම	RDA	178.31	90.37	60%
7	1319	මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P26)	RDA	203.86	14.57	10%
8	1320	මාතලේ ඉලුක්කුඹුර ලග්ගල පාර (P27)	RDA	204.32	21.22	14%
9	1322	රඹුක්කන මාර්ග ව්‍යාපෘතිය	RDA	176.22	64.75	75%

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.ලක්ෂ.)	2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
ගොඩනැගිලි						
1	1418	පොතුවිල් උප ඩිපෝව	SLTB		15.00	80%
2	1420	මැදවච්චිය ටයර් කර්මාන්ත ශාලාව	SLTB		30.71	60%
ජල සම්පාදන, වාරිමාර්ග, ජල විදුලි උත්පාදන						
1	1366	ඇඹිලිපිටිය ජල ව්‍යාපෘතිය	NWS&DB	105.94	35.92	97%
2	1370	කෙත්හේන ජල ව්‍යාපෘතිය	NWS&DB	325.24	41.60	48%
3	1374	තිස්සමහාරම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ වැඩිදියුණු කිරීම් (අදියර !!)	NWS&DB	143.34	22.6	19.7%
විවිධ						
1	1373	ගැටඹේ මහවැලි ගඟ දිගේ ගැබියන් බැම්ම ඉදි කිරීම	MASL	213.68	45.26	40%
ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය						
1	1336	කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම් (සංඛ්‍යාව8)	SMRR	86.28	36.78	83%
2	1337	මාතලේ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව4)	SMRR	51.62	36.04	64%
3	1338	නුවර එළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව5)	SMRR	66.87	11.00	42%
4	1339	රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව8)	SMRR	109.39	46.35	57%
5	1340	නුවර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව9)	SMRR	234.75	50.68	41%
6	1341	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව8)	SMRR	125.45	38.46	56%
7	1342	පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව4)	SMRR	56.79	37.32	99%
8	1343	මොනරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව5)	SMRR	75.40	69.54	89%
9	1344	බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව6)	SMRR	71.50	29.20	67%

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
10	1347	කොලඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව8)	SMRR	93.65	44.51	65%
11	1348	ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව13)	SMRR	158.28	48.14	47%
12	1349	කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව8)	SMRR	82.15	36.11	62%
13	1350	හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව8)	SMRR	93.01	46.73	78%
14	1351	ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව6)	SMRR	116.07	23.91	70%
15	1352	මාතර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව6)	SMRR	65.89	15.25	50%
16	1353	පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව5)	SMRR	112.55	29.26	41%
17	1354	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව16)	SMRR	274.67	65.86	77%
18	1355	අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව5)	SMRR	90.59	64.94	76%
19	1356	මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව3)	SMRR	60.71	36.23	77%
20	1357	යාපනය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව2)	SMRR	11.55	5.37	95%
21	1358	මන්නාරම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව1)	SMRR	17.56	1.49	25%
22	1359	මුලතිව් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව1)	SMRR	58.82	3.84	13%
23	1360	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව1)	SMRR	14.01	12.18	95%
24	1361	වව්නියාව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව2)	SMRR	33.30	4.57	38%
25	1365	කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාලම්(සංඛ්‍යාව2)	SMRR	23.99	1.50	18%
උපදේශන සේවා						
1	-	උපදේශන සේවා			7.0	
කොන්ක්‍රීට් අංගන						
1	051	රත්මලාන			62.31	
2	053	බෝපිටිය			15.96	

අංක	කේතය	ව්‍යාපෘතියේ නම	සේවාදායක	ව්‍යාපෘති වටිනාකම (රු.මි.)	2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය	
					ආදායම (රු.මි.)	භෞතික
3	052	වේරගන්තොට			25.76	
4	812	මැදවච්චිය			10.64	
5	1276	ලුනුගම්වෙහෙර			16.03	
යාන්ත්‍රික සේවා						
1	006	ප්‍රවාහන අංශය			57.63	
2	005	යාන්ත්‍රික වැඩපල			35.63	
3	005	සැකිලි අංශය			12.74	
4	897	විදුලි සංඥා පද්ධති			193.59	

කෙටි යෙදුම්

RDA	මාර්ග සංවර්ධන අධිකාරිය
CMC	කොළඹ මහ නගර සභාව
SMRR	ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
MOH	සෞඛ්‍ය අමාත්‍යාංශය
NWS&DB	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
MASL	ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

ගැටබේ ගෙබියන් ව්‍යාපෘතිය








මානව සම්පත්

සංස්ථාවේ ප්‍රධාන වත්කම මානව සම්පත් වේ. සංස්ථාවේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මානව සම්පත් මානසිකව හා ශාරීරිකව තෘප්තිමත් කළ යුතුය.

ඕනෑම සංවිධානයක සැබෑ ශක්තිය වේගයෙන් වෙනස් වන ව්‍යාපාරික පරිසරයක එහි කාර්ය මණ්ඩලයේ හැකියාවන් මත රඳා පවතින බව සංස්ථාව විශ්වාස කරන බැවින්, සංස්ථාව මානව සම්පත් සංවර්ධනය සඳහා ආයෝජනය කර ඇත. එබැවින්, පුරෝකථනය කරන ලද ප්‍රතිඵල ලබා ගැනීම සඳහා හොඳින් නිපුණ හා දක්ෂ ශ්‍රම බලකායක් සිටීම සඳහා සියලු උත්සාහයන් යොමු කරන ලදී.

සංස්ථාව මාර්ග සංවර්ධන අධිකාරියට ඒකාබද්ධ කිරීමේ කැබිනට් තීරණයට අනුව, සංස්ථාවේ අරමුණු සහ අරමුණු ඉටු කර ගැනීමට බොහෝ වැඩසටහන් වලට මානව සම්පත් ක්‍රියාවලියට නොහැකි විය.

1. කාර්ය මණ්ඩල සුභසාධනය

සංස්ථාව විසින් අනුග්‍රහය දක්වන ලද වෛද්‍ය රක්ෂණ ක්‍රමය සහ සේවකයින් සඳහා වූ කම්කරු වන්දි රක්ෂණ ක්‍රමය අලුත් නොකළේය.

අතීත සේවකයින්ට කළමනාකාරිත්වය විසින් ප්‍රදානය කරන ලද පැමිණීමේ දීමනාවක් හිමි විය.
ඉංජිනේරුවන් සඳහා - රු. 20000/- සහ අනෙකුත් අයට මසකට රු. 8500/-.

2. සේවක ඇගයීම

2024 වසරේ වත්මන් ආර්ථික අර්බුදයට පෙර වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලයට විශේෂ සිහිවටනයක් සහ රන් කාසියක් ප්‍රදානය නොකළේය.

3. වැටුප් වැඩිවීම

රජය විසින් 2025 අප්‍රේල් 01 වන දින සිට වැටුප වැඩි කිරීම.

4. බාහිර ආයතන සඳහා පුහුණුව ලබා දීම.

විශ්වවිද්‍යාල ජාතික ආධුනිකත්ව මණ්ඩලය වැනි බාහිර ආයතන විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍රවල පුහුණුව ලබා දීම සඳහා අප වෙත එවන ලද පිරිස් නිසි ලෙස පුහුණු කිරීමෙන් රටේ සංවර්ධනයට දායක වීමක් ලෙස අඛණ්ඩව සිදු කෙරේ.

අපගේ කාර්ය මණ්ඩල ශක්තිය

තනතුර	2020	2021	2022	2023	2024
සිවිල් ඉංජිනේරුවන්	76	114	77	34	29
යාන්ත්‍රික සහ විදුලි ඉංජිනේරුවන්	07	09	09	06	05
ගණකාධිකාරීවරු	07	07	07	05	00
අනෙකුත් මාණ්ඩලික නිලධාරීන්	17	21	20	06	03
අධිකාරීවරුන් (සිවිල්/ යාන්ත්‍රික/ විදුලි)	24	37	28	20	09
සැලසුම් ශිල්පීන්/ ප්‍රමාණ සමීක්ෂක	05	05	05	-	12
ආරක්ෂක කාර්ය මණ්ඩලය	51	46	43	41	21
ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි	99	95	92	85	40
අධීක්ෂණ සහ අනෙකුත් නිපුණතා ශ්‍රේණි	334	300	284	240	124
එකතුව	594	634	565	437	248

2024 වසර තුල SD & CC මුහුණ දෙන අභියෝග

මෑත දශක කිහිපය තුළ SD&CC මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල නියැලීමෙන් ආර්ථිකයේ ප්‍රවාහන සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ස්වේච්ඡා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හරහා ආයතනයේ සේවාවන්ගෙන් අඩක් අඩු කිරීම හේතුවෙන්

• ශ්‍රම බලකායේ අඩුවීම - ස්වේච්ඡා විශ්‍රාම වැටුප් ක්‍රමය (VRS) හේතුවෙන්, සැලකිය යුතු සේවකයින් සංඛ්‍යාවක් සංවිධානයෙන් ඉවත් වී ඇති අතර, එමඟින් සමස්ත ශ්‍රම බලකාය අඩු වේ.

• වැඩ බර වැඩිවීම - සේවක සංඛ්‍යාව අඩු වීම හේතුවෙන් ඉතිරි කාර්ය මණ්ඩලයට දැන් වැඩි වගකීම් බරකට මුහුණ දීමට සිදුවිය හැකිය.

• කාර්යක්ෂමතාව කෙරෙහි බලපෑම - අඩු කරන ලද කාර්ය මණ්ඩලය සංවිධානයේ මෙහෙයුම් සහ පරිපාලන කාර්යක්ෂමතාවයට සෘජුවම බලපෑ හැකිය.

• සීමිත නව බඳවා ගැනීම්– ඉවත් වූවන් වෙනුවට ක්ෂණික බඳවා ගැනීම් සිදු නොවන්නේ නම්, හිඟය වඩාත් බරපතල වේ.

• සංවිධානාත්මක ප්‍රතිව්‍යුහගතකරණය - සේවා අඩු කිරීම හේතුවෙන් සංවිධානයට රාජකාරි වෙන් කිරීම්, වාර්තාකරණ ව්‍යුහයන් සහ අභ්‍යන්තර මෙහෙයුම් සංශෝධනය කිරීමට සිදුවිය හැකිය.

වැඩි දියුණු කිරීම සඳහා කෙටි හා දිගු කාලීන උපාය මාර්ග

ආයතනික සැලැස්මෙන් ක්‍රියාත්මක කිරීම

- නිෂ්පාදනය සහ අලෙවිය වැඩි කිරීම සඳහා කොන්ක්‍රීට් අංගනවල සැපයුම් දාමය වැඩිදියුණු කිරීම සඳහා සම්පත් වෙන් කිරීම. පිරිවැය ඵලදායී පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා පර්යේෂණ සහ සංවර්ධනය සමඟ කොන්ක්‍රීට් අංගනවලට නව තාක්ෂණය හඳුන්වා දීම, (කෙටි කාලීන)

- ක්‍රමානුකූල ස්ථාවර ක්‍රියාවලියක් හරහා වගකීම් මට්ටම (උප කොන්ත්‍රාත්කරුවන්ට සහ ශ්‍රමයට ගෙවීම්) අඩු කිරීම. (කෙටි කාලීන)

- 2024 වර්ෂයේදී සංස්ථාව විවිධ ව්‍යාපාරික ක්‍රියාකාරකම් වලින් ආදායම් උපයා ගැනීම සඳහා මූලපිරීම් ගෙන ඇත,

  – CTB බස් රථ අලුත්වැඩියා කිරීමට භාර ගැනීම
  – පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ වාහන අලුත්වැඩියා කිරීමට, නඩත්තු කිරීමට සහ සේවා කිරීමට භාර ගැනීම.

- පාලම් ගොඩනැගිලි හෝ මාර්ග අංශයේ C1, CS1 ශ්‍රේණිගත මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් හෝ වැඩි ගණනක් අත්පත් කර ගන්න. එම ව්‍යාපෘති කොන්ක්‍රීට් අංගන සමඟ ප්‍රධාන මුදල් උත්පාදක / ආදායම් උත්පාදක බවට පත්වනු ඇත. (දිගු කාලීන)

විගණන කමිටු වාර්තාව-2024

2010.12.14 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED 55 හි විධිවිධානවලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය, නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සම්බන්ධයෙන් ඔවුන්ගේ අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට සහාය වීම සහ කළමනාකරණයට සුදුසු උපදෙස් ලබා දීමයි.

SD&CC හි විගණන කමිටුව සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 01/2021 අනුව පත් කරන ලද නිරීක්ෂකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් අදාළ බලධාරීන් විසින් අනුමත කරන ලද විමර්ශන නියමයන්ට අනුකූලව කමිටුව මෙහෙයවනු ලැබේ.

- ඩබ්ලිව්.ඒ.එන්. තුෂාරි මහත්මිය - සභාපති/මණ්ඩල අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
- දිනූෂා කෝර්න්කඩුව මහතා - සාමාජික/මණ්ඩල අධ්‍යක්ෂ
- කේ.කේ.ජී. චන්ද්‍රිකා මහත්මිය - සාමාජික/මණ්ඩල අධ්‍යක්ෂ
- එස්.සංජීව මහතා - ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂක/ (2024-01-01 සිට 2024-07-02 දක්වා)
- ජී.එම්.ඩී.ටී. පෙරේරා මහත්මිය - ජාතික විගණන කාර්යාලයේ නිරීක්ෂක/ (2024-07-03 සිට 2024-12-31 දක්වා)
- ඩී.කේ.ටී. සමන්මලි මහත්මිය - රේඛීය අමාත්‍යාංශයේ නිරීක්ෂක/ප්‍රධාන අභ්‍යන්තර විගණක

අවශ්‍ය විටෙක සහ අවශ්‍ය අවස්ථාවන්හිදී විමර්ශන සහ වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා SD&CC කළමනාකරණ නිලධාරීන් විගණන කමිටු රැස්වීම්වලට කැඳවන ලදී.

2024 මූල්‍ය වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් තුනක් (03) පවත්වන ලදී.

2024 වර්ෂය තුළ, විගණන කමිටුව,

1. 2022 සහ 2023 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවධානය යොමු කරන ලදී.

2. ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රසම්පාදන සැලැස්ම 2024 ඉදිරිපත් කිරීම සඳහා අවධානය යොමු කරන ලදී.

3. විගණකාධිපතිවරයාගේ අවසන් වාර්තාව 2022 සමාලෝචනය කර ගිණුම්කරණ අඩුපාඩු සහ එහි සඳහන් නීතිරීතිවලට අනුකූල නොවීම නිවැරදි කිරීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

4. 2024 දී නිකුත් කරන ලද විගණකාධිපතිවරයාගේ අතුරු වාර්තා කෙරෙහි අවධානය යොමු කරන ලද අතර ගිණුම්කරණ අඩුපාඩු සහ එහි සඳහන් නීතිරීතිවලට අනුකූල නොවීම නිවැරදි කිරීම සඳහා පසු විපරම් ක්‍රියාමාර්ග සමාලෝචනය කරන ලදී.

5. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා 2023 මූල්‍ය ප්‍රකාශනය සමාලෝචනය කරන ලදී. (SLFRS/LAKS)

6. ගැටළු වල ස්වභාවය, අංශ ප්‍රධානීන්ගේ ප්‍රතිචාර සහ සටහන් වූ අඩුපාඩු මහහරවා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණන විමසුම්, 2021, 2022, 2023 සහ 2024 අභ්‍යන්තර විගණන විමර්ශන වාර්තා සමාලෝචනය කරන ලදී.

7. සංස්ථාවේ සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා මිලදී ගැනීම්, ගබඩා, වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේ, අත්තිකාරම්, සුළු මුදල් ගෙවීම්, ව්‍යාපෘති මෙහෙයුම්, ඉන්වෙන්ටරි කළමනාකරණය, බිල්පත්, රථ වාහන කළමනාකරණය, වැටුප් ගෙවීම්, මූල්‍ය සහ අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු වැනි මානව සම්පත් යන ක්ෂේත්‍රවල අභ්‍යන්තර පාලන පද්ධති කිහිපයක් ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

8. අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයේ ශක්තිය සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලද අතර ඔවුන්ගේ සොයාගැනීම් විශේෂයෙන් අවදානම් ක්ෂේත්‍රවලට අයත් බව සලකා බලන ලදී.

9. රජය විසින් නිකුත් කරන ලද සියලුම අදාළ නීති රීති සහ චක්‍රලේඛවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අවධානය යොමු කරන ලදී.

10. කමිටුවේ නිර්දේශ මත අදාළ කළමනාකරු/නිලධාරියා විසින් ගනු ලැබූ පසු විපරම් ක්‍රියාමාර්ග සමාලෝචනය කරන ලදී.

කමිටුවේ විමර්ශන නියමයන් සියලු ද්‍රව්‍යමය අංශවලින් විෂයයන් ආවරණය කරන බව විගණන කමිටුවේ මතයයි.



ඩබ්ලිව්.ඒ.එන්. තුෂාරි

සභාපති - විගණන කමිටුව

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශයෙන් දක්වා ඇත. මේවා ඔවුන්ගේ වාර්තාවේ දක්වා ඇති විගණකවරුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

මූල්‍ය වර්ෂය අවසානයේ සංස්ථාවේ කටයුතු තත්ත්වය සහ මූල්‍ය වර්ෂය සඳහා සංස්ථාවේ ලාභය හෝ අලාභය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙමින්, සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අධ්‍යක්ෂවරුන් අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන අනුකූලව ක්‍රියාත්මක කර ඇත, සාධාරණ හා විචක්ෂණශීලී විනිශ්චයන් සහ ඇස්තමේන්තු සකස් කර ඇති අතර අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීම සඳහා ප්‍රමාණවත් ගිණුම් වාර්තා සංස්ථාව විසින් තබා ගැනීම සහ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන්ට, චක්‍රලේඛ සහ මූල්‍ය පනත හරහා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූල වන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගැනීම සහ එම සන්දර්භය තුළ වංචා සහ අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම කෙරෙහි නිසි සැලකිල්ලක් දැක්වීම ද ඔවුන් සතු වගකීමකි.

ගිණුම් සකස් කිරීමේදී අධ්‍යක්ෂවරුන් අඛණ්ඩ පැවැත්මේ පදනම අනුගමනය කරයි. මුදල් ප්‍රවාහ, අතේ ඇති ව්‍යාපෘති සහ ණය ගැනීමේ පහසුකම් ඇතුළුව, 2023 මූල්‍ය වර්ෂය සඳහා සංස්ථාවේ අයවැය පිළිබඳ විමසීම් සහ සමාලෝචනයකින් පසුව, අධ්‍යක්ෂවරුන්, මෙහෙයුම් දිගටම කරගෙන යාමට SD&CC සතුව ප්‍රමාණවත් සම්පත් ඇති බව සලකති.

සංස්ථාව වෙනුවෙන් සහ වෙනුවෙන්,

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණය නීතිගත සංස්ථාව



ඉංජිනේරු S.M කුෂාන් දේවින්ද

සභාපති

විගණකාධිපති වාර්තාව **2024**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAE/B/SD&CC/01/FS/2024/03
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 ඔක්තෝබර් 21 දින

සභාපති
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෙතිනිත නෑ නියමිත අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය විචාරනය

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ ("සංස්ථාව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක මිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වැවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වැවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය විචාරනය සඳහා දෙනාවි කොටසේ සංකථිත කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශනා සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යවනය සඳහා පදනම

(අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.මිලියන 1,411.00 ක් වූ අතර 2024 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ලාභය රු.මිලියන 6,812.52 ක් විය. එසේම වත්කම් ඉක්මි වූ බැරකම්වල වටිනාකම රු.මිලියන 4,562.51 ක් වූ අතර ජංගම වත්කම් ඉක්ම වූ ජංගම බැරකම් ප්‍රමාණය රු.මිලියන 4,161.91 ක් විය. තවද 2024 සැප්තැම්බර් 10 දිනැති අංක අමප/24/1684/608/032-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම සංස්ථාවේ අංශ 03 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ඒකාබද්ධ කිරීමට තීරණය කර තිබුණද මේ දක්වා සංස්ථාව විසින් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් කටයුතු කර නොනිබුණි. ඒ අනුව අඛණ්ඩ පැවැත්මේ අවිනිශ්චිතතාවයක් විගණනයේදී නිරීක්ෂණය වුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 01 හි 25 ඡේදයට පටහැනිව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නොමැති බව සටහන් අංක 2.1.2 මගින් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 1හි 32 ඡේදය අනුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මඟින් අවශ්‍ය දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් හිලව් නොකළ යුතු වුවද ඉදිකිරීම් ණයගැනියන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙලින් රු. මිලියන 31.86 ක් සහ රු.මිලියන 0.52 ක් වූ වත්කම් වගකීම් ශේෂයන් එකිනෙකට හිලව් කර නිබුණි.

(ඇ) ඇවර කිරීමට නියමිත පරිපාලිත සමාගමක් වන ඩෙව්කොෂෝවා (පුද්ගලික) සමාගමෙහි ආයෝජන මුදල් වූ රු.මිලියන 9.21 ක් හා සමාගමෙන් ලැබිය යුතු රු.මිලියන 25.31ක ණයගැනි ශේෂය නහවුරු කර ගැනීම් සඳහා ශේෂ නහවුරු කිරීම් හෝ කිසිදු විගණන සාක්ෂ්‍යක් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පනාත්මක රාමුවෙහි ඡේද අංක 4.8 සිට 4.14 ට පටහැනිව මහෙනිකව පවතින තොග ශේෂය සහ ගිණුම්කරණ පද්ධතිය තුළ දක්වා ඇති තොග වටිනාකම් අතර වෙනස වූ රු. මිලියන 58.25 ක ශේෂයක් තොග ගැලපුම් ගිණුමක ඇතුළත් කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය තුළ ඇතුළත් වී නිබීම හේතුවෙන් සංස්ථාවේ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අධි ගණනය වී නිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන වෙළඳ ණයකම්, විවිධ ණයකම්, ගෙවිය යුතු එකතු කළ අගය මත බදු, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, කොන්ත්‍රාට් අංගන ණයැතියෝ සහ මිල දී ගැනීමේ අත්තිකාරම් ශේෂයන් සහ එහි උපලේඛන සංසන්දනය කිරීමේ දී රු. මිලියන 126.06 ක හඳුනා නොගත් වෙනසක් පැවතුණි.

(ඊ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව එකතුව රු. මිලියන 845.01 ක් වූ ඉදිකිරීම් ණයගැති, රඳවා ගැනීම්, ණයගැතියෝ (මාර්ග සංඥා), ණයගැතියෝ (කොන්ත්‍රාට් අංගන), ප්‍රතිමා ස්ථාපිත කෝපරේෂන්

(පරිපාලන සමාගම) වෙත සිදු කරන ලද මිල දී ගැනීම් අත්තිකාරම් සහ ඉන්ධන තැන්පතු යනාදියේ නිවැරදිභාවය පරීක්ෂා කිරීමට අවශ්‍ය සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොවූණි.

(ඇ) සංස්ථාවේ ණයහිමියෙකු වූ 2024 දෙසැම්බර් 31 දිනට පූර්ගලික සමාගමකින් ලැබිය යුතු ශේෂයක් ලෙස රු.මිලියන 27.81 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර, සංස්ථාව අදාළ සමාගමෙන් සේවාවන් ලබාගෙන වැට බදු සහිතව ගෙවීම් කර තිබුණ ද එම සමාගම වැට බදු ලියාපදිංචි ආයතනයක් නොවූ බැවින් වැට බදු හිලව් කර ගත නොහැකි විය. 2020 වර්ෂයේ සිට අදාළ මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් නිවැරදි කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් සැකීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා සංස්ථාව තබා තිබේ ද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ 1.2 (අ) සහ (ඇ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ යම් සංමාර්ගිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් ප්‍රපාදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධිනාමවලට අනුකූලව	සලකුණු කොටස්
(ඇ)	2009 අංක 09 දරන රාජිය මූල්‍යකරණ පනත	2024 මාර්තු මස 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 6.11 ක රාජිය මූල්‍යකරණයෙහි මූල කොට සහ පසු ගෙවීම් හිඟය ලේ මත පදනම් වූ දඩ මුදල් රු.මිලියන 1.06 කින් වියහැකියි. මුළු මූල් විටිනාකම වූ රු.මිලියන 7.17 ක් ලේඛිය ආදායම් සඳහාකිරණවලින්ගුව ගෙවා නොමැතිකි.
(ඈ)	2015 අංක 13 දරන ආර්ථික ස්ථිරතා හා සාමාජික මංගලෝපන පනත	2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංස්ථාවේ විවිධ ගෙවීම් ප්‍රතු ආර්ථික හේතු නැතිකුව වූ රු.මිලියන 67.50 ක් ලේඛිය ආදායම් සඳහාකිරණවලින්ගුවට හියහැකි දීනාව ලේඛනය අනාගතයේදී සහන්ගිරීම් ඔබ්බෙන් ද ඔබ පසාදා තිබූ දඩ මුදල් රු.මිලියන 33.78 ක් ද ගැනුම්කරු නීතිය මඟ මුදල් රු.මිලියන 101.23 ක් විගණිත දීනා දක්වා ගෙවීම් කර නොමැතිකි.
(ඉ)	1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ පනත	2024 දෙසැම්බර් 31 දිනා දක්වා වූ මිහ සමාජ ආරක්ෂණ මූල මුදල් රු. මිලියන 40.35 ක් ගෙවීමට කටයුතු කර නොමැතිකි.
(ඊ)	2002 අංක 14 දරන වතකඩ කළු ආඥා පිහ මිදි පනත	2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වතකඩ කළු අඟය පිහ මූල රු.මිලියන 1,700.28 ක් හා රු.මිලියන 1,267.34 ක දඩ මුදල් ද ඒකාබද්ධ වශයෙන් රු.මිලියන 2,967.62 ක් විගණිත දීනා දක්වා ගෙවීම් කර නොමැතිකි.
(ඉ)	ඇගැයීමයි (මාර්ග සංඥා)	95.77	අඩු සහාර	පවත්නා පද්ධතියට අනුකූල වීය යුතුය.
				කිරීම සඳහා ඇති අවශ්‍යතා සපුරා ඇති බවට ඉදිරිපත් කළ යුතුය.
(ඊ)	ඇගැයීමයි (ගොඩනැඟිලි ආ.ක්‍ර.),	63.84	අඩු සහාර	පවත්නා පද්ධතියට අනුකූල වීය යුතුය.
				-๑๑-
				කිරීම සඳහා සකසා ඇති අවශ්‍යතා සපුරා ඇති බවට ඉදිරිපත් කළ යුතුය.
(උ)	පුළිබඳ ස්ථාවර අක්ෂරේඛන් (පවිත්‍රාලික සම්මතය) වෙත සිදු කරන ලද මිල දී ගැනීම අත්හිටුවීම	2.17	අඩු සහාර	පවත්නා පද්ධතියට අනුකූල වීය යුතුය.
				මිල දී ගැනීම අත්හිටුවා කාර්මික පරීක්ෂණ සඳහා සකසා ඇති අවශ්‍යතා සපුරා ඇති බවට සහතික කිරීම සඳහා ඇති අවශ්‍යතා

							කිරීම විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.
(උ)	ඉන්ධන නැන්පතු	15.31	ශේෂ සනාථ කිරීම	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	ඉන්ධන නැන්පතු රු.මිලියන 15.31 සඳහාවන උපලේඛනය මේ සමග අමුණා ඇත.	ඉන්ධන නැන්පතු ශේෂය නිවැරදි කර ගැනීම සඳහා ශේෂ සනාථ කිරීම විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාවේ ණයගිමියෙකු වූ 2024 දෙසැම්බර් 31 දිනට පුද්ගලික සමාගමකින් ලැබිය යුතු ශේෂයක් ලෙස රු.මිලියන 27.81 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, සංස්ථාව අදාළ සමාගමෙන් සේවාවන් ලබාගෙන වැට බදු	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2025 වර්ෂයේදී අවශ්‍ය වෙන් කිරීම් මූල්‍ය ප්‍රකාශනවලට සිදු කරනු ඇත.	වැට බදු සඳහා ලියාපදිංචි නොවූ ආයතනයකට වැට සහිතව ගෙවීම් කිරීම තුළින් සිදු වූ පාඩුව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

	සහිතව ගෙවීම් කර නිබුණ ද එම සමාගම වැට බදු ලියාපදිංචි ආයතනයක් නොවූ බැවින් වැට බදු හිලව් කර ගත නොහැකි විය. 2020 වර්ෂයේ සිට අදාළ මුදල් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා නිබුණි.				
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගැනීම් ශේෂය රු.මිලියන 574.13 ක් වූ අතර එයින් රු.මිලියන 275.95 ක් අවුරුදු 5කට වැඩි කාලයක් නිරවුල් කර ගැනීමකින් තොරව පැවතුණි. ජංගම වත්කම් යටතේ පෙන්වනු ලබන රඳවා ගැනීම් ශේෂයෙන් රු.මිලියන 232.73 ක් වසර 02 සිට 05 දක්වා කාලයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොනිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2024 දෙසැම්බර් 31 දිනට රඳවා ගැනීමේ ශේෂය රු.මිලියන 574.13 ක් වූ අතර එයින් රු.මිලියන 275.95 ක් වූ අවුරුදු 5 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව පැවතීමට හේතු ලෙස ප්‍රධාන වශයෙන් බලපානුයේ එම ව්‍යාපෘතිවල පැවති දෝෂ නිවැරදි නොකිරීම් (Defects Rectification) සහ ඇතැම් ව්‍යාපෘති අතරමග නැවතී තිබීම හේතුවෙනි.	වගකිව යුතු නිලධාරීන් විසින් ලැබිය යුතු රඳවාගැනීම් ශේෂයන් අයකර ගැනීමට හිවිසුම් ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් ණයගැනියන්, කොන්ත්‍රාට් අංගන ණයගැනියන් සහ රථවාහන සංඥා	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2024 දෙසැම්බර් 31 දිනට ණයගැනි ශේෂයන්ගෙන් රු.මිලියන 10.49 ක් අවුරුදු 5	වගකිව යුතු නිලධාරීන් විසින් අය විය යුතු ශේෂයන් අයකර ගැනීමට ඵලදායී

ක්‍රමවේදයන් භදුන්වා දී කාලීනව ණයගැති ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

කට වැඩි කාලයක් හා අවුරුදු 2-5 දක්වා කාලය තුළ රු.මිලියන 39.87 ක් හිඟව පවතින බව දක්වා ඇති අතර පොදුවේ ගත් කල එම ණයගැති ශේෂයන් සහිත ව්‍යාපෘතිවලට අදාළ සේවාදායකයින් (Client) විසින් නිසි අනුමැතියකින් තොරව ව්‍යාපෘති ආරම්භ කිරීම, එම ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරවා නොගැනීම, පැවති දේශපාලන බල අධිකාරයන් වෙනස් වීම වැනි කරුණු කොටගෙන එම ණයගැති ශේෂයන් මේ දක්වා ලබා ගැනීමට නොහැකි වී ඇත.

පද්ධති ණයගැතියන් පිළිවෙලින් රු.මිලියන 93.79 ක්, රු.මිලියන 63.84 ක් සහ රු.මිලියන 95.77 ක් තුළ පිළිවෙලින් රු.මිලියන 10.49 ක්, රු.මිලියන 37.71 ක් හා රු.මිලියන 6.86 ක් වර්ෂ 5 ඉක්ම වූ ණයගැතියන් විය.

1.5.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි සහ විවිධ ණයහිමි ශේෂය රු.මිලියන 1,130.37 ක් වූ අතර එයින් රු.මිලියන 128.46 ක් අවුරුදු 5කට වැඩි කාලයක සිටද රු.මිලියන 737.40 ක් වසර 02 සිට 05 දක්වා කාලයක් තුළ ද නිරවුල් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සියළුම හිඟ බදු මුදල්, සියළු බැංකු ණය හා සියළු ණය හිමියන් පියවීම සඳහා අමාත්‍යාංශ මට්ටමින් දැනටමත් සැලසුම් කරමින් ඇත.	මෙම ශේෂයන් නිරවුල් කිරීමට කඩිනමින් ඵලදායීව පියවරක් ගත යුතුය.
(ආ)	ලංකා බැංකුව, සමපත් බැංකුව සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ලබා ගෙන තිබුණු ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 2,665.58ක හිඟ ණය වාරික සහ හිඟ පොලී වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් ගෙවීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සභාපතිතුමා හා අධ්‍යක්ෂක මණ්ඩලය බැංකු ණය පියවීම සඳහා 25/1182/809/057-I අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ඇත.	හිඟ ණය වාරික හා පොලිය නිරවුල් කිරීමට සංස්ථාව විසින් ඵලදායී ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය.
(ඇ)	සංස්ථාව විසින් ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලෙන් රු. මිලියන 100 ක බිල්පත් වටපම කිරීම යටතේ ලබාගෙන තිබූ ණය	නව	පවත්නා පද්ධතියට අනුකූල විය	සභාපතිතුමා හා අධ්‍යක්ෂක මණ්ඩලය බැංකු ණය පියවීම සඳහා 25/1182/809/057-I අමාත්‍ය	හිඟ ණය මුදල් නිරවුල් කිරීමට සංස්ථාව විසින් ඵලදායී ක්‍රමවේදයක්

	මුදලෙන් රු. මිලියන 79.2 ක් පමණක් නැවත අරමුදල වෙත ගෙවා තිබුණ අතර ඉතිරි රු.මිලියන 20.8 ක් (පොලිය රහිත) නැවත ගෙවීම් කර නොතිබුණි.		යුතුය.	මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ඇත.	හඳුන්වා දිය යුතුය.
(ඇ)	සමපත් බැංකුවෙන් රු. මිලියන 70 ක අයිරා පහසුකමක් ලබාගෙන තිබුණ අතර එම අයිරා පහසුකම ද ඉක්මවා රු. මිලියන 4.06 ක අයිරා පහසුකමක් ද ලබා ගෙන ඇති අතර අයිරා පොලිය ලෙස රු. මිලියන 9.47 ක මුදලක් සමඟ 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 83.53 ක් වී තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සභාපතිතුමා හා අධ්‍යක්ෂක මණ්ඩලය බැංකු ණය පියවීම් සඳහා 25/1182/809/057-I අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ඇත.	බැංකු අයිරාව හා පොලිය ගෙවීමට ඵලදායී ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැඩ අත්හැර දැමූ ව්‍යාපෘති 5 කට අදාළ රු. මිලියන 16.5 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	වැඩ අවසන් ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් ශේෂයන් නොපියවී පවතින්නේ, තවමත් අවසන් බිල්පත් නිකුත් කර නොතිබීමයි. අවසන් බිල්පත් නිකුත් කළ වහාම අවශ්‍ය ගැලපීම් සිදුකර සියළු ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	වැඩ අත්හැර දැමූ ව්‍යාපෘතිවල මෙම ශේෂයන් නිරවුල් කිරීමට අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධව අවශ්‍ය පියවර ගත යුතුය.

(ථ)	2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 17කට අදාළව ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 329.04 ක ශේෂයක් 2025 ජූලි 24 දිනවන විටත් නිරවුල් කර නොතිබුණු අතර විගණනයට ලබා දුන් තොරතුරු අනුව ව්‍යාපෘති 13 ක්ම වැඩ අත්හිට වූ, වැඩ නිම වූ සහ වැඩ අත්හැර දැමූ තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.	නව පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	මෙම ව්‍යාපෘති සඳහා අවසාන බිල්පත් නිකුත් කර නොමැත. අවසාන බිල්පත් නිකුත් කළ විගස සියළු ගැලපීම් කර ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	-එම-	

1.5.3 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉදිකිරීම් අංශයේ වැඩ අත්හැර දැමූ සහ වැඩ සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළ රු.මිලියන 4.61 ක මිල දී ගැනීම් අත්තිකාරම් පැවතී අතර එම අත්තිකාරම් නිරවුල් වීමකින් තොරව පැවතීමට හේතු විගණනයට ඉදිරිපත් නොවිය.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අංක 1178, 1183, 1179 යන ව්‍යාපෘතිවලට අදාළ ගැණුම් ඇණවුම් මඟින් කොන්ක්‍රීට් මිලදී ගෙන ඇතත්, ඒවා නගමුලුපුරවර අනෙකුත් ව්‍යාපෘති සඳහා භාවිතා කර ඇත. එම නියා ගැණුම් ඇණවුම් නිරවුල් කිරීමේ දී ඇති වූ ගැටළු සහගත තත්ත්වයක් මත මෙම ශේෂය පෙන්නුම් කරයි. අංක 1185 හා 1138 ව්‍යාපෘතිවල මුදල් අය කර ගැනීමට ඇත.	මිලදී ගැනීම් අත්තිකාරම් නියමිත කාලය තුළ පියවීම් කළ යුතු අතර කළමනාකරණය විසින් පවතින තත්ත්වය අධීක්ෂණය කර මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතුය.	

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන විගණන පනතේ 18(6) වගන්තිය	2024 දෙසැම්බර් 31 දිනට හිඟ විගණන ගාස්තු රු.මිලියන 14.18 ක් විගණකාධිපති වෙත ගෙවා නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදුකරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත.	මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් කඩිනමින් නිරවුල් කිරීමට කළමනාකරණය පියවර ගත යුතුය.
(ආ)	2019 දෙසැම්බර් 17 දිනැති හා අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	රාජ්‍ය ආයතනවල ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට (Procuring Entity) මෙන්ම එම රාජ්‍ය ආයතන සිදු කරනු ලබන ව්‍යාපාරික සේවා සැපයීම් (Vendor) සිදු කිරීමට රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ (e-Procurement System in Sri Lanka) ලියාපදිංචි වී එම පද්ධතිය යොදා ගන්නා ලෙස දක්වා තිබුණ ද, සංස්ථාව	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2025 වසර තුළ සිදු කරනු ඇත.	චක්‍රලේඛයට අනුකූලව රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වීම සහ ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය.

	2025 අගෝස්තු මාසයවන විටත් රජයේ ඉලෙක්ට්‍රොනික ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වී නොතිබුණි.				

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ පනත අනුව 2024 දෙසැම්බර් 31 දින දක්වා වූ හිඟ සමාජ ආරක්ෂණ බදු මුදල් රු.මිලියන 40.35 ක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදුකරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත.	පනතට අනුකූලව මෙම ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 6.11 ක ජාතිය ගොඩනැගීමේ බදු සහ එම බද්ද නොගෙවීම නිසා ඒ මත පනවා ඇති දඩ මුදල රු.මිලියන 1.06 ක්ද වශයෙන්, මුළු	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේ දී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත.	-එම-

	බදු වටිනාකම වූ රු.මිලියන 7.17 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා නොතිබුණි.				
(ඇ)	2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත අනුව 2005 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා සංස්ථාව විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව වූ රු.මිලියන 67.50 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ඒ මත පනවා තිබුණු දඩ මුදල රු.මිලියන 33.78 ක් ද ඇතුළුව හිඟ බදු මුදල් රු.මිලියන 101.23 ක් වගඋත්තර දින දක්වා ගෙවීම් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අමාත්‍ය මණ්ඩල නිරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත.	-එම-
(ඈ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත අනුව 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.මිලියන 1,700.28 ක් හා රු.මිලියන 1,267.34 ක දඩ මුදල් ද වශයෙන් එකතුව රු.මිලියන 2,967.62 ක් වගඋත්තර දින දක්වා ගෙවීම් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	අමාත්‍ය මණ්ඩල නිරණවලට අනුව සංස්ථාව ඉදිරියේ දී සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ගෙවීම් සිදු කරනු ඇත.	-එම-

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 1,411.00 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. මිලියන 2,246.23 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 835.23 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉදිකිරීම් ව්‍යාපෘති අංශයේ ආදායම රු. මිලියන 211.67 න් වැඩි වීම සහ විකුණුම් පිරිවැය රු.මිලියන 217 න් අඩු වීම හා මූල්‍ය හා අනෙකුත් වියදම් රු.මිලියන 506.82 න් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

විස්තරය	2024 රු. මිලියන	2023 රු. මිලියන	වෙනස (වැඩි වීම /අඩු වීම) රු. මිලියන	වෙනස් ප්‍රතිශතය සියයට
ආදායම	430.29	218.62	211.67	97
විකුණුම් පිරිවැය	976.45	1193.51	(217.06)	18
අනෙකුත් ආදායම	98.37	105.81	(7.44)	7
පරිපාලන වියදම්	153.98	209.43	(55.45)	26
අනෙකුත් වියදම්	603.93	935.63	(331.70)	35
මූල්‍ය ආදායම	6.42	154.77	(148.35)	96
මූල්‍ය වියදම්	211.73	386.85	(175.12)	45

2.3 අනුපාත විශ්ලේෂණය

අනුපාතය	2024	2023
<u>ලාභදායී අනුපාත</u>		
දළ ලාභ අනුපාතය (සියයට)	(127)	(446)
ඉද්ධ ලාභ අනුපාතය (සියයට)	(328)	(953)
මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (සියයට)	(37)	(56)
<u>ද්‍රවශීලතා අනුපාත</u>		
ජංගම අනුපාතය (වාර ගණන)	1: 1.37	1: 1.37
ක්ෂණික අනුපාතය (වාර ගණන)	1:1.29	1:1.27
<u>තෝලන අනුපාත</u>		
ණය වත්කම් අනුපාතය (සියයට)	218	205
ණය අනුපාතය (සියයට)	(184)	(:95)

පසුගිය වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ඉද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් (953) ක් හා (328) ක් වශයෙන් ඉහළ අගයක් වාර්තා වූ අතර 2023 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයේ අඩුවීමක් පැවතිය ද එය මෙහෙයුම් ක්‍රියාකාරිත්වයේ අඩු වීම මත සිදු වී ඇති බවද නිරීක්ෂණය වේ. සංස්ථාවේ ජංගම අනුපාතය සහ තෝලන අනුපාතයන් ද අභිනකර තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය. තෝලන අනුපාත අනුව සංස්ථාව අධිතෝලන මට්ටමේ එනම් සංස්ථාවේ වත්කම් හා හිමිකම් වලට සාපේක්ෂව අධික ණය ප්‍රමාණයක් පවතී.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2022 වර්ෂයේ දී රු.මිලියන 11.29 ක වියදමක් දරා සංස්ථාව හයිඩ්‍රොලික් පොම්පය සමඟ ජැක් යන්ත්‍රයක් මිල දී ගෙන තිබුණු අතර මෙම යන්ත්‍රය වාර්තාව නිකුත් කරන දිනය දක්වා භාවිතා කිරීමට නොහැකිව අක්‍රීය තත්ත්වයේ පැවතුණි. එබැවින් යන්ත්‍රය මිල දී ගැනීමේ අරමුණ ඉටු කර ගත නොහැකිව තිබුණු අතර ඒ සඳහා දැරූ පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ජැක් යන්ත්‍රයේ නිෂ්පාදන සමාගමවන CCL Stressing Systems LTD UK ආයතනය විසින් එහි ප්‍රධාන සැපයුම්කරුවන Showa Shoji Co. ආයතනය හරහා මෙම අක්‍රිය යන්ත්‍රය වෙනුවට නව Stressing Jack යන්ත්‍රයක් ලබා දෙන බවට ලිඛිතව SD&CC ආයතනය වෙත දැනුම් දී ඇත.	කඩිනමින් මෙම අක්‍රිය යන්ත්‍රය වෙනුවට සැපයුම් ආයතනය එකඟ වූ පරිදි නව යන්ත්‍රයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) 2022 වර්ෂයේදී සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන ලද මැණික් කැනීම් ව්‍යාපෘතිය මඟින් සංස්ථාවට රු.මිලියන 6.02 ක ශුද්ධ ලාභයක් සිදු වී තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මැණික් ගල් විකිණීම සඳහා එවකට ක්‍රියාත්මක වූ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අවසරය ලැබී තිබුණ ද, ඉන් පසුව ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොමැත.	මැණික් ගල් විකිණීම සිදු කර පතල වැසීමේ කටයුතු නොපමාව අවසන් කළ යුතුය.

බලපත්‍ර භිමිකමක් නොමැතිව සංස්ථාවේ මුදල් හා ශ්‍රමය භාවිතා කරමින් සිදු කරන ලද ඵලදායී නොවන ව්‍යාපෘතියක් වූ අතර මෙම ව්‍යාපෘතිය අවසන් වී වසර 02 ක් ගත වුවද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ගෙවන ලද රු.මිලියන 0.675 ක තැන්පතු මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ද සිදුකර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් වගා ව්‍යාපෘතියක් ආරම්භ කර ක්‍රියාත්මක කර තිබූ අතර එම වගා කටයුතු වලින් කිසිදු ආදායමක් උපයා නොතිබුණු අතර එහි වියදම රු.මිලියන 3.32 ක් විය. තවද මෙම වගා කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය බීජ, පොහොර හෝ වෙනත් ඒ සම්බන්ධ කිසිදු වියදමක් ඉහත සඳහන් පිරිවැය තුළ ඇතුළත්ව නොමැති අතර, සේවක වැටුප් සහ අනිකාල

නව අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් නැවත, එම අනුමැතිය යළි ලබා ගත් අතර, පළමුව මැණික් ගල් විකිණීමේ ක්‍රියාවලිය සිදු කර පසුව පතල වැසීම සිදු කිරීමට අපේක්ෂා කරයි. මැණික් වත්කම් ලෙස එම වටිනාකම වත්කම් ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා තොග පාලන අංශය වෙත යොමු කර ඇති අතර, දැනට එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතී.

නව පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

මෙම කාලයේ දී රට තුළ පැවති අභිතකර තත්ත්වය හේතුවෙන් සේවකයන්ට පඩි ගෙවමින් කොන්ක්‍රීට් අංගන තුළ රඳවා ගැනීමට සිදු විය. එබැවින් මොවුන් ඵලදායී කටයුත්තකට යොමු කිරීමේ අදහසින් සභාපතිතුමාගේ උපදෙස් පරිදි වගා ව්‍යාපෘති ආරම්භ කරනු ලැබිණි. නිසිකලට වර්ෂාව නොලැබුණු බැවින් වගාව අසාර්ථක වී ඇත.

ආයෝජනයක් කළ යුතු නම් නිශ්චිතවම ආර්ථික වශයෙන් ඵලදායී ව්‍යාපෘති කෝරා ගෙන ආයෝජනය කළ යුතුය.

ප්‍රධාන වශයෙන්ම ඇතුළත්ව තිබුණි.

3.2 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුලදී ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති හයක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවති අතර ව්‍යාපෘති තුනක වැඩ අත්හැර දැමූ අතර ව්‍යාපෘති හතක වැඩ අත්හිටුවා තිබුණි. එයින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති (ongoing) 2කින් රු.මිලියන 14.38 ක අලාභයක් වාර්තා කර තිබුණු අතර වැඩ අත්හිටවූ (Suspended) ව්‍යාපෘති 5කින් හා වැඩ අත්හැර දැමූ (Terminated) ව්‍යාපෘති 3කින් පිළිවෙලින් රු.මිලියන 40.63ක් සහ රු.මිලියන 165ක් වශයෙන් අලාභ වාර්තා කර තිබුණි. අමතරව 2024 වර්ෂය සඳහා ග්‍රාමීය පාලම් ඉදිකිරීම් අංශය විසින් ව්‍යාපෘතීන් 12 කට අදාළව රු. මිලියන 81 ක අලාභයක් ද වාර්තා කර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2023 වර්ෂයේ දී මුලා ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘතීන් බොහොමයක් අතරමග නැවතිනි. 2024 වර්ෂයවන විට ඉන් බොහොමයක් ද්විපාර්ශවික එකඟතාවය මත (Mutual terminated) ගිවිසුම් අවලංගු කර වැඩබිම් ඉවත් කරගෙන ඊයදම් අවම කර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම ඉතිරි අත්හිටවූ ව්‍යාපෘතිවලද ඊයදම් අවම කර ගැනීමට කටයුතු යොදා ඇත.	නියමිත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට සහ අලාභ අවම කර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් ක්‍රියාත්මක කළ යුතුය.

(ආ)	1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත අනුව 2024 දෙසැම්බර් 31 දින දක්වා සංස්ථාව විසින් නොගෙවූ සේවක අර්ථසාධක අරමුදල් මත රු.49,528,746 ක් අධිභාර වශයෙන් ගෙවා නිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	සංස්ථාව මෙවන විට සියළු ගෙවීම් සිදු කර ඇත.	කාලීනව ව්‍යවස්ථාපිත ගෙවීම් කිරීම තුළින් අධිභාරයන් ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 51 කට අදාළව ප්‍රමාද වන්දි ලෙස රු. මිලියන 264.26 ක් අඩු කර ගෙන නිබුණු නමුත් ඉන් රු.මිලියන 176.35 ක් අවුරුදු 5කට වැඩි කාලයක් සිට අයකර ගෙන නොනිබුණි. වසර 02 සිට 05 දක්වා අයකර නොගත් ප්‍රමාද වන්දි ශේෂය රු. මිලියන 38.75 ක් විය.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද වන්දි ශේෂය ව්‍යාපෘති 51 කට අදාළව රු.මිලියන 264.26 ක් වූ අතර අනවශ්‍ය ප්‍රමාදයන් නිසා කාල දීර්ඝ කිරීම් අනුමත නොවීම හේතුවෙන් එම ප්‍රමාද වන්දි ශේෂයන් ලැබිය යුතු මුදලක් ලෙස සලකා නොමැත.	ව්‍යාපෘති ගිවිසුම් ගත කාලය තුළ නිම කිරීම තුළින් ප්‍රමාද වන්දි ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සිවිල්, යාන්ත්‍රික සහ විදුලිමය ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා නැනීම කටයුතු ආදී සංස්ථාවේ ඉලක්කගත අරමුණු ඉටු කරගැනීම සඳහා ඉදිකිරීම්, කොන්ක්‍රීට් අයිතම නිෂ්පාදනය සහ අලෙවිය හා රථවාහන ආලෝක පද්ධතිය සහ සේවා සැපයීම යන අංශ තුන මගින් කටයුතු කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේ දී සංස්ථාව රු. මිලියන 1,205.7 ක මෙහෙයුම් ලාභයක් ලබා තිබූ අතර දළ ලාභ අනුපාතය සියයට 127 ක ඍණ අගයක් වාර්තා කර තිබුණි. ඉදිකිරීම් අංශය සහ කොන්ක්‍රීට් අයිතම නිෂ්පාදනය සහ අලෙවි අංශය මගින් ලද රු. මිලියන 452.71 ක් සහ රු. මිලියන 84.07 ක දළ ලාභයන් සංස්ථාවේ සමස්ත ලාභය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘතීන් බොහොමයක් අතරමග නැවතිනි. 2024 වර්ෂයවන විට ඉන් බොහොමයක් ද්විපාර්ශවික එකඟතාවය මත (Mutual terminated) ගිවිසුම් අවලංගු කර වැඩබිම ඉවත් කරගෙන වියදම් අවම කර ගැනීමට කටයුතු කර ඇත.	අනවශ්‍ය ප්‍රමාදයන් හා වියදම් වලක්වා ව්‍යාපෘති ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 වගන්තිය අනුව සංස්ථාව වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය යටතේ රත්මලාන අංගනයට ටොන් 25 Crane යන්ත්‍රයක් කුලියට ගැනීම සඳහා 2023 ජනවාරි 03 දින ආයතන 11 ක් වෙතින් මිල ගණන් කැඳවා තිබුණි. ලංසු කැඳවීමේ අවම කාල සීමාව දින 07 ක් වුව ද දින 02 ක් පමණක් ලබා දී තිබූ බැවින් ලංසු 03 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	යන්ත්‍රයේ අවශ්‍යතාවය මත දින 02 ක් තුළ මිල ගණන් කැඳවා ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ප්‍රමාණවත් කරහකාරිත්වයක් ඇතිවන අයුරින් කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතුය.
(ආ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 වගන්තිය අනුව ලංසු ඇගයීම අවසන් කළ පසු ප්‍රසම්පාදන අත්පොතේ සඳහන් කර ඇති ආකෘතිය අනුව තාක්ෂණික ඇගයීම කමිටුව විසින් ලංසු ඇගයීම වාර්තාවක් පිළියෙල කර, සියලුම යනාථ කිරීම ලේඛන සහිතව එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සකස් කළ වාර්තාවක් නොමැතිව නාවල අංගනයට 25 Ton Crane යන්ත්‍රයක් කුලියට ගැනීම වෙනුවෙන් පිරමිඩ	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	මෙම අඩුපාඩුකම මහභරවාගෙන ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් කර ඇති පරිදි ප්‍රසම්පාදන කටයුතු නිසි අයුරින් කිරීමට පියවර ගනු ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුකූලව කටයුතු කිරීමට නිසි අවධානය යොමු කළ යුතුය.

විල්මා ආයතනයට රු.මිලියන 3.06 ක මුදලක් ගෙවා තිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයට වැඩබිමවල පවතින සේවාදායකයා වෙත බිල් නොකරන ලද තොගයෙහි (Material at Site) වටිනාකම රු.මිලියන 90.69 ක් වූ අතර වැඩ අත්හිට වූ සහ වැඩ අත්හැර දැමූ ව්‍යාපෘතිවලට අදාළව රු.මිලියන 7.30 ක සහ සම්පූර්ණ කරන ලද (Completed) ව්‍යාපෘතිවලට අදාළව රු. මිලියන 0.55 ක තොග ශේෂයන් ද නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	බිල් නොකරන ලද තොගය හෙවත් Material at Site වෙනුවෙන් සේවාදායකයා හා අප ආයතනයට මුදල් ලබා දී ඇත. එම මුදල් විශේෂයෙන් වැඩ අත්හිටවූ හෝ අවසන් ව්‍යාපෘති වෙනුවෙන් සේවා දායකයාගේ අවසාන බිල්පතින් අඩු කරනු ලබයි. එසේ අඩු කිරීමෙන් පසු අවශ්‍ය සටහන් ගැලපීම් ගිණුම්වලට කරනු ඇත.	වැඩබිමවල පවතින සේවාදායකයා වෙත බිල් නොකරන ලද තොග නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2006 ජනවාරි 25 දිනැති හා අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (iii) වගන්තිය අනුව	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	වැඩ අවසන් ව්‍යාපෘතිවලට අදාළ අත්තිකාරම් ශේෂයන් නොපියවී පවතින්නෙ, නවමත් අවසන්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව වැඩ ආරම්භ කිරීමේ

	කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙවීම කිරීමෙදී ගෙවීම්වලින් සියයට 90ක් සම්පූර්ණ වීමට ප්‍රථම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගනු ලැබිය යුතු වුවත් සම්පූර්ණයෙන්ම වැඩ නිමකළ ව්‍යාපෘති 20 කට අදාළව රු.මිලියන 20.62 ක අත්තිකාරම් ද සියයට 90-100 ත් අතර වැඩ නිමකළ ව්‍යාපෘති 3කට අදාළ රු.මිලියන 23.57 ක් ද මේ දක්වා අය කරගෙන නොතිබුණි.	බිල්පත් නිකුත්කර නොතිබීමයි. අවසන් බිල්පත් නිකුත් කළ වහාම අවශ්‍ය ගැලපීම් සිදුකර සියළු ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ඇත.	අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.6 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ඩෙව්කෝ ෂෝවා ආයතනයෙන් සංස්ථාවට ලැබී ඇති මෝටර් රථ 05 ක් 2025 අගෝස්තු දක්වා සංස්ථාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සංස්ථාව විසින් දීර්ඝ කාලීනව භාවිතා කරනු ලබන වටිනාකම රු.මිලියන	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මෙම ඉඩම සංස්ථාවට පවරා ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ඇත.	භාවිතා කරන වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

	69.64 ක් වූ ඉඩම 8 ක්ද සංස්ථාවට පවරා ගැනීමට හෝ දීර්ඝ කාලීනව බදු පදනමට ලබා ගැනීමට මෙ දක්වා නොහැකි වී තිබුණි.				
(ආ)	2024 දෙසැම්බර් 18 දිනැති හා අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව ඔියලූ රාජ්‍ය ආයතනවල ආර්ථික වශයෙන් ඵලදායී නොවන හෝ භාවිතය සඳහා අවශ්‍ය නොවන වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වුවත් සංස්ථාවේ ධාවන කටයුතු සඳහා යොදා නොගන්නා වාහන ඒ අනුව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	දැනට සංස්ථාව සතුව පවතින වාහන සංස්ථාවේ රාජකාරී කටයුතු සඳහා යොදා ගන්නා බැවින් 2024 දෙසැම්බර් 18 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි සඳහන් පරිදි අපහරණ ක්‍රියාවලියට සංස්ථාව සතු වාහන ඉදිරිපත් කිරීම සිදු කර නොමැත.	චක්‍රලේඛය අනුව භාවිතා නොකරන ආර්ථිකමය නොවන වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 වර්ෂයේ පැවති ටෙන්ඩර් ක්‍රියාවලියෙන් වත්කමේ විකිණීමෙන් රු.මිලියන 1.17 ක ඉද්ධ ලාභයක් ලබා තිබුණ ද මෝටර් රථ 4 ක් විකිණීමෙන් සංස්ථාවට රු.මිලියන 1.55 ක අලාභයක් වී තිබුණි.	නව	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2024 අඟෝ දුව්‍ය ටෙන්ඩරයේ තක්සේරු වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ සංස්ථාවේ හා මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ශ්‍රේණියේ අක්දැකීම් සහිත පළපුරුදු නිලධාරී මඩුල්ලක් මඟින් සිදු කර ඇත.	අවම වශයෙන් තක්සේරු වටිනාකම් පදනම් කර ගෙන විකිණීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ අංක 01/2021 දරන රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොත 6.6 ඡේදය අනුව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන දින 117 ක කාලයක් ප්‍රමාදව 2025 ජූනි 25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය.	2024 සැප්තැම්බර් 31 දිනට ස්වේච්ඡා වන්දි ක්‍රමයක් යටතේ විශාල සේවක පිරිසක් විශ්‍රාම යාම හේතුවෙන් දෛනික රාජකාරි මෙන්ම අවසාන ගිණුම් පිළියෙල කිරීම ඉතාමත් දුෂ්කර වී ඇත.	රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව නියමිත දිනට පෙර විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

4.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවධානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 2021/01 දරන රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොත - 6.6 ඡේදය අනුව 2022 හා 2023 වර්ෂ සඳහා සංස්ථාවේ වාර්ෂික වාර්තාව 2025 ඔක්තෝබර් මාසයවන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය	2022 වාර්ෂික වාර්තාව කිහිපවරක් සංශෝධනයට ලක්වීම හේතුකොටගෙන ප්‍රමාද විය. නමුත් 2025 සැප්තැම්බර් 12 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලයට භාරදෙන ලදි. 2023 වාර්තාව ද ඉතා ඉක්මනින්ම පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ඇත.	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගත යුතුය.

එච්.ඒ.ඩී.චාන්දනී අබේසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ) වෙනුවට

කළමනාකරණ විගණන වාර්තාවට පිළිතුරු
2024

සහකාර විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක.306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණනි,

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාවට පිළිතුරු සැපයීමයි.

1.4 . මූල්‍ය ප්‍රකාශන

1.4.1

(අ). ඉදිරියේදී වන්කම් වගකීම් හෝ ආදායම් වියදම් ගිලිහී නොයෑමට කටයුතු කරමි.

(ආ). දැනටමත් සෑලකිය යුතු අගයකින් නිවැරදි කිරීම් සිදුකර ඇත. ඉදිරියේදී සම්පූර්ණයෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි.

1.4.2

(අ). දැනටමත් නිවැරදි කිරීම් සිදුකර ඇත.

(ආ). නොපියවූ සුළු මුදල් නිරවුල් කරමින් පවතී.

(ඇ). පරිගණක ගත ඉන්වෙන්ට්‍රි මොඩියුලයක් නිර්මාණය කර ගැනීමට සභාපතිතුමා විසින් මොරටුව විශ්ව විද්‍යාලය සමග සාකච්ඡා කරමින් පවතී.

1.4.3

(අ). නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරමි.

(ආ). 2025 ගිණුම් සඳහා නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ.

(ඇ). මේ වන විට නිවැරදි කිරීම් සිදුකර ඇත.

(ඈ). ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන සංසන්දනය කර නිවැරදිව සකස් කර ඉදිරිපත් කරමි.

(ඉ). 2025 ගිණුම් සඳහා නිවැරදි කිරීම් සිදුකරනු ලැබේ.

1.4.4

- අඛණ්ඩ පැවැත්ම පිළිබඳව නිවැරදි තක්සේරුවක් 2025 මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරමි.

1.4.5

(අ) - (ආ). මේ සඳහා ප්‍රමාණවත් නොරතුරු නොමැති නිසා 100% ක ණය ප්‍රතිපාදන ඩිදු කරමි.

(ඇ) - (ඇ) – (ඉ) - (ඊ). 2024 වර්ෂය සඳහා ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබාගැනීම සඳහා ඉල්ලීම් කල ද ඒවාගෙන් බොහොමයකට ද මේ වන තෙක් පිළිතුරු ලිපි ලැබී නොමැත. එම නිසා 2025 වර්ෂයට අදාල අවසන් ගිණුම් වාර්තා පිළියෙළ කිරීමෙන් අනතුරුව 2025 වර්ෂය සඳහා ණයගැති ශේෂ තහවුරු කිරීමේ ලිපි ලබාගැනීම සඳහා බලාපොරොත්තු වන්නෙමු.

(උ). නිසි නොරතුරු නොලැබීම හේතුවෙන් 2025 වර්ෂය තුලදී සිට මේ දක්වා නිවැරදි කිරීමට නොහැකි විය. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඌ). ඉන්ධන තැන්පතු සඳහා ලබා දුන් අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

1.5 . ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1

(අ). 2025 වර්ෂයේදී අවශ්‍ය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන වලට ඩිදු කිරීමට කටයුතු කරමි.

(ආ). පැරණි ව්‍යාපෘති වල පැවති දොෂ නිරාකරණය කිරීමට අදාල අංශයන් සමග කටයුතු කරමින් පවතී.

(ඇ). අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කර ණයගැති අංශයන්ගෙන් අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

1.5.2

(අ). සියළුම ගිණ මුදල්, සියළු බැංකු ණය හා ඩියළු ණය ගිණියන් පියවීම සඳහා අමාත්‍යාංග මට්ටමින් දැනටමත් සාකච්ඡා කරමින් ඇත.

(ආ) - (ඇ) - (ඇ). සභාපතිතුමා හා අධ්‍යක්ෂක මණ්ඩලය බැංකු ණය පියවීම සඳහා 25/1182/809/057-I අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කරනු ඇත.

(ඉ). අත්හැර දැමූ ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් නිරවුල් කරගැනීම සඳහා අදාල පාර්ශව සමඟ කටයුතු සිදුකරමින් පවතී.

(ඊ). මෙම ව්‍යාපෘති සඳහා අවසන් බිල්පත් නිකුත් කර නොමැත.අවසාන බිල්පත් නිකුත් කළ විගස අවශ්‍ය සියළු ගෙවීම් ඩිදු කර ගිණුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.

1.5.3

- මිලදී ගැනීමේ අත්තිකාරම් නියමිත කාලය තුල පියවීමට දැනුවත් කිරීම් කර ඇත.මිලදී ගැනීමේ අත්තිකාරම් පියවීමේ ප්‍රගතිය පරීක්ෂාව මාසිකව නිරීක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත.

1.6 . නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

(අ). ඉදිරි වර්ෂයේදී ගෙවීමට තීරණය කර ඇත.

(ආ). E - රාජ්‍ය ප්‍රසම්පාදනය (E-Government Procurement) සඳහා ලියපදිංචි කිරීමේ ක්‍රියාවලිය දැනට ක්‍රියාත්මක කරමින් පවතී.

- ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු වැඩිදුර යාවත්කාලීන කිරීම් දැනුම් දෙනු ලැබේ.

1.7 . බදු රෙගුලාසිවලට අනුකූල නොවීම.

(අ) - (ආ) - (ඇ) - (ඇ). අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සංස්ථාව ඉදිරියේදී සිදුකරන ලබන කටයුතුවලදී සියලු ගෙවීම් සිදුකිරීමට කටයුතු කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 . මූල්‍ය ප්‍රතිඵල

- ලබන වසරේදී මෙහෙයුම් ලාභයක් ලබා ගැනීම වෙනුවෙන් කටයුතු කරමි.

2.2 . ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය.

- තවදුරටත් වියදම් පාලනය කර ආදායම් ඉහළ දැමීමට උත්සාහ කරමි.

2.3 . අනුපාත විශ්ලේෂණය.

- සංස්ථාවේ ණය නිදහස් කර ගැනීමට කටයුතු කරමින් සිටිනි. ඒ අනුව ප්‍රංගම සහ තෝලන අනුපාතයන් පාලනය කර ගැනීමට කටයුතු කරමි.

3. මෙහෙයුම් සමාලෝචනය.

3.1 . අනාර්ථික ගනුදෙනු

(අ). CCL Stressing Systems LTD UK ආයතනයෙන් නව ජැක් යන්ත්‍රයක් ලබා දීමට එකඟ විය. ඒ සඳහා ඔවුන් බිල්පත (Invoice) සහ පිරිවිතර (Specification) අප වෙත යොමුකරන ලදී.

- එම ආයතනය විසින් අප වෙත එවා තිබූ පිරිවිතරවල (Specification) නිවැරදිභාවය පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍යාධිකාරිතුමා විසින් තාක්ෂණික අගැයීම් කමිටුවක් (TEC) පත්කරනා ලදී. එම පිරිවිතරයන් අපගේ සේවා අවශ්‍යතාවයන්ට ගැලපෙන බව අපගේ තාක්ෂණික අගැයීම් කමිටුව විසින් තහවුරු කරමින් අප වෙත වාර්තාවක් ලබා දී ඇත.
- එම බිල්පත අප විසින් භාණ්ඩ නිෂ්කාශණය කරන ආයතනයක් වෙත යොමු කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගෙවිය යුතු රේගු ගාස්තු වශයෙන් රුපියල් 1,225,740.00 ක් ගෙවිය යුතු බව එම නියෝජිත ආයතනය දන්වා එවන ලදී.
- ඒ අනුව එම රේගු ගාස්තු CCL Stressing Systems LTD UK ආයතනයට ගෙවන ලෙස ලිපියක් මගින් අප විසින් යවන ලදී.

(ආ). මැණික් ගල් 2025.12.16 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලද අතර පතල වැඩීමේ කටයුතු 2026.01.14 දිනට ප්‍රථම ඒදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ). පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණ වාර්තාවක නිරනයන් සලකා බැලීමෙන් අනතුරුව පමණක් ආයෝජනයන් ඉදිරියේදී සිදු කරනු ලැබේ.

3.2 . හඳුනාගත් පාඩු.

(අ). අලාභයන් අවම කර ගැනීම සඳහා ගැටළු කාරී ව්‍යාපෘති අක්‍රිය කර ගැනීමට කටයුතු යොදා ඇත. එසේම අතර මග නවතා දමා ඇති ඇතැම් ව්‍යාපෘති ලාභදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නව මිල ගණන් යටතේ ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇත. නව ව්‍යාපෘති ලබා ගැනීමේදී අලාභය අවම කර ගැනීමට කටයුතු සැලසුම් කෙරේ.

(ආ). සංස්ථාව මේ වන විට බියළුම අර්ථ සාධක ගෙවීම් සහා අධිභාරයන් පියවා ඇත. එසේම 2022 ජූලි මස සිට මාසිකව බියළු ගෙවීන් සිදු කරමින් පවතී.

(ඇ). නිර්දේශ අනුව ශ්‍රීවිසුම ගත කාලය තුල ව්‍යාපෘති නිම කිරීමට සැලසුම් කෙරේ.

3.3 . මෙහෙයුම් අකාර්යක්ෂමතා.

- 2023 වර්ෂයේ දී මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව ව්‍යාපෘතීන් බොහොමයක් අතරමග නැවතිනි. 2024 වර්ෂය වන විට ඉන් බොහොමයක් ද්විපාර්ශ්වික එකඟතාවය මත (Mutual terminated) ශ්‍රීවිසුම් අවලංගු කර වැඩබිම් ඉවත් කරගෙන වියදම් අවම කර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම ඉතිරි අත්හිටවූ ව්‍යාපෘති වලද වියදම් අවම කර ගැනීමට කටයුතු යොදා ඇත.

3.4 . ප්‍රසම්පාදන කළමනාකරණය.

(අ), (ආ). සැපයුම් අංශය හරහා සියලු ප්‍රසම්පාදන කටයුතු කිරීම තුලින් මෙම අඩුපාඩුකම් මගහරවා ප්‍රසම්පාදන අන්පොත් සඳහන් කර ඇති පරිදි ප්‍රසම්පාදන කටයුතු නිසි අයුරින් කිරීමට කටයුතු කර ඇත.

3.5 . කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.

(අ). වැඩබිම් වල පවතින බිල් කරන ලද තොගය හෙවත් Material At Site අවසන් බිල් පනින් අඩු කෙරුණු ඇත. එසේම වැඩබිම් වල පවතින අනෙකුත් තොගයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ). වැඩ අවසන් වුවද ඇතැම් ව්‍යාපෘති වල අවසන් බිල්පත් සහතික වීමේ ප්‍රමාදයන් නිසා අත්තිකාරම් මුදල් පියවා ගැනීමට නොහැකි වී ඇත. බොහොමයක් නොපියවූ අත්තිකාරම් අවසන් බිල්පත සහතික වූ පසු පියවා ගැනීමට කටයුතු කරනු ඇත.

3.6 . වාහන පදිංචිය කළමනාකරණය.

(අ). i. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හා ඩෙවිකොං සේවා ආයතනයෙන් සංස්ථාවට ලැබී ඇති මෝටර් රථ 05.

- (253-6268), (252-4565), (65-7584) යන වාහන 03 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අප වෙත ලබාදුන් අතර, එම වාහන ධාවන තත්ත්වයේ නොපවතී. එබැවින් එම වාහන අලුත්වැඩියා කිරීමෙන් පසු ආදායම් බලපත්‍රය ලබාගෙන සංස්ථාවට පවරා ගැනීම සිදුකළ යුතුය. දැනට ඒ සඳහා වෙන්කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් ඒ සඳහා යම් කාලයක් ගතවේ.
- (51-1441) හා (GD-8062) වාහන Dewkashowa ආයතනයට අයත් වන අතර, එම ආයතනය දැනට ක්‍රියාකාරීත්වයේ නොපවතින බැවින් අදාල පවරා ගැනීම් සිදු කර ගැනීමට නොහැකි වී ඇත.

ii. ඉඩම් 8 ක් සංස්ථාවට පවරා නොගැනීම.

	ඉඩමේ නම	ඉඩමේ ප්‍රමාණය	ඉඩමේ විස්තරය
01	වේරගන්තොට	අක්. 4 පර්. 8	මෙම ඉඩම සංස්ථාව වෙත පවරා දෙන ලෙස මීනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දිගින් දිගටම ඉල්ලීම් කිරීමෙන් පසු මනිසංගනය ඉඩම් කොමසාරිස් කාර්යය වෙත යොමු කර ඇත.පසුව මෙම ඉඩම පවරා ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ එකඟතාවය හා තත්ව වාර්තාවද ඉඩම් නියෝග 222 යටතේ පිඹුර හා වාර්තාවද මනිසංගණය ඉඩම් කොමසාරිස් කාර්යාලය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යවා ඇත.
02	පේරාදෙණිය 01-02	පර්. 102.2	මෙම ඉඩම සංස්ථාව වෙත පවරාදීමට මහනුවර ගණඛඩ කෝරළය ප්‍රාදේශීය ලේකම් වෙතින් දිගින් දිගටම ඉල්ලීම් කර ඇති අතර එම ඉඩමේ අනවසර පදිංචිකරුවෙකු සිටි නිසා ඔහුට විරුද්ධව නෙරපීම් නඩුවක් පවරා තිබූ අතර එම නඩුව අවසන් වීමෙන් පසු ඉඩම පවරා දීමේ කටයුතු සිදුකල හැකි බව දන්වා තිබිනි.පසුව සංස්ථාව ද ඔදිහත් වී නඩුව අවසන් කල අතර ඉඩම පවරාදීමේ කටයුතු කිරීම සඳහා මේ වනවිට මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනීම් කටයුතු සිදු කර ඇති අතර පිඹුර ලැබීමට නියමිතය.
03	මැදවච්චිය	අක්. 1 පර්. 32	සංස්ථාව වෙත පවරා දෙන ලෙස දිගින් දිගටම මැදවච්චිය ප්‍රදේශීය ලේකම් ගෙන් ඉල්ලීම් කර ඇත. ප්‍රාදේශීය ලේකම් මේ සම්බන්ධයෙන් පලාත් ඉඩම් කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇත.

04	රත්මලාන මොරට්ටුව ලේඩිකැතරින්වත්ත (පොල්වත්ත)	පර්. 113.5	මෙම ඉඩම ඝංස්ථාව වෙත පවරා දෙන ලෙස ඉල්ලා මොරටුව ප්‍රාදේශිය ලේකම් වෙතින් දිගින් දිගටම ඉල්ලීම් කර ඇති අතර එම ඉඩම ලේඩි කැතරින් යන අයගෙන් රජයට පවරා ගැනීම සම්බන්ධව ලේඛන සොයාගැනීමට නොහැකි බව මොරටුව ප්‍රාදේශිය ලේකම් ප්‍රකාශ කර ඇති අතර ඝංස්ථාව වෙත පවරා දීමේ කටයුතු නතර වී ඇත.
05	ලුණුගම්වෙහෙර	අක්. 5	ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් වෙතින් පවරා ගැනීම සඳහා ඉල්ලීම් කිරීමෙන් පසුව දෙබරවැව ඉඩම් කොමිසාරිස් විසින් පවරා දීම සඳහා අනුමැතිය ඉල්ලා ඉඩම් කොමිසාරිස් ජනරාල් වෙත යොමුකර ඇත.
06	කලහගල	අක්. 2	මෙම ඉඩම ඝංස්ථාව වෙත පවරා දෙන ලෙස කලහගල ප්‍රාදේශිය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත.
07	මැදවච්චිය	අක්. 1 පර්. 112	2002 වර්ෂයේ සිටම මෙම ඉඩම ඝංස්ථාව වෙත පවරා දෙන ලෙස මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් වෙතින් දීර්ඝ කාලීනව ලිපි ඉදිරිපත් කරමින් ඉල්ලීම් කිරීමෙන් පසු මැදවච්චිය ප්‍රාදේශිය ලේකම්, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසු මෙම ඉඩම ඝංස්ථාව වෙත පවරා දීම සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.පසුව ඉඩම් අමාත්‍යාංශය මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අවශ්‍ය පියවර ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදුව.මැදවච්චිය ප්‍රාදේශිය ලේකම් විසින් එම ඉඩම දීර්ඝ කාලීන බද්දක් මත ඝංස්ථාව වෙත පවරා දීමට එකඟතාවය ලබා ගැනීම සඳහා අනුරාධපුර නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමුකර ඇති අතර දීර්ඝ කාලීන බදු පදනම් මත හෝ එම ඉඩම ඝංස්ථාව වෙත පවරාදෙන ලෙස ඉල්ලා සාමාන්‍යාධිකාරී විසින් ද අනුරාධපුර නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීම් කර ඇත.
08	වීරවිල	පර්. 132.2	මෙම ඉඩම දැනට ඝංස්ථාව බුක්තිය නොදරන අතර ඝංස්ථාව වෙත පවරා දෙන ලෙස ජූල් පල්ලම ප්‍රාදේශිය ලේකම්ගෙන් කර ඇති ඉල්ලීමට පිළිතුරු වශයෙන් එකී ඉඩම් වෙනත් පාර්ශවයක් ඉල්ලීම් කරන බැවින් ඝංස්ථාවට අවශ්‍යද නැද්ද යන්න දන්වා එවන ලෙස ලිපියක් එවා ඇත.

(ආ). 2024 දෙසැම්බර් 18 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හී සඳහන් පරිදි අපහරණ ක්‍රියාවලිය ඕදු කිරීමට ඉදිරියේදී කටයුතු කරමි.

(ඇ). 2024 අගෝස්තු දුව්‍ය තොග්ගරයේ තක්සේරු වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ ඝංස්ථාව මගින් පත් කරන ලද කමිටුවක් මගින් වන අතර, ඉදිරියේදී උපරිම තක්සේරු වාර්තාව පදනම් කරගෙන කමිටුවේ අනුමැතිය ලබාගෙන විකිණීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය.

4.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

- 2025 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට අවසන්කර ලබා දීමට කටයුතු කරමි.

4.2 . වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

- 2022 වාර්ෂික වාර්ථාව මේ වන විටත් පාර්ලිමේන්තු සභාගත කර ඇත. 2023 වාර්ෂික වාර්ථාව මේ වන විටත් අමාත්‍යාංශයට බාර දී ඇත. 2024 වාර්ෂික වාර්ථාවේ කෙටුම්පත නිවැරදි කිරීම් සඳහා නැවත ලබා දී ඇත. ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව නියමිත දිනට වාර්ථා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

ඉංජී. ඩබ්. ඒ. සී. ආර්. ගාන්ත කුමාර
සාමාන්‍යාධිකාරී.

GENERAL MANAGER
State Development & Construction Corporation
No:97,Borupana Road, Ratmalana.

අත්සන් කළේ/ ඉංජී. (ආචාර්ය) එස්. බී. විජේකෝන්
සභාපති.
රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව.

අමාත්‍ය මණ්ඩලයේ අවධානයට ලක්විය යුතු කරුණු

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ ආරක්ෂා කිරීම සඳහා සාධාරණීකරණය

රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව වසා දැමීම ලංකාවේ අනාගත සංවර්ධනයට සහ එහි ඉදිකිරීම් කර්මාන්තයේ ස්ථාවරත්වයට සැලකිය යුතු ඍණාත්මක ප්‍රතිවිපාකවලට හේතු විය හැක.SD &CC අත්‍යවශ්‍ය වන්නේ මන්දැයි පහත කරුණු ඉස්මතු කරයි

ඉදිකිරීම් අංශයේ SD & CC හි අද්විතීය කාර්යභාරය.

ඉංජිනේරු සංස්ථාව සමග කොන්ත්‍රාත්කරුවෙකු ලෙස ක්‍රියාත්මක වන ආයතන කිහිපයෙන් එකක් ලෙස SD & CC රාජ්‍ය සංවිධාන අතර සුවිශේෂී ස්ථානයක් ගනී. ප්‍රසම්පාදනය සහ සැලසුම් කිරීම කෙරෙහි අවධානය යොමු කරන සේවාදායක සංවිධාන ලෙස ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන මාර්ග සංවර්ධන අධිකාරිය , ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, විදුලිබල මණ්ඩලය සහ මහවැලි අධිකාරිය වැනි අනෙකුත් රාජ්‍ය සංවිධාන මෙන් නොව,SD & CC රට පුරා ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. එහි අසමසම ධාරිතාව, විශේෂඥතාව සහ පුළුල් අත්දැකීම් එය මහා පරිමාණ සහ විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ තිරණාත්මක සාධකයක් බවට පත් කරයි.

පිරිවැය-ඵලදායී සහ උසස් තත්ත්වයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වේ.

වසර 54ක ඉතිහාසය තුළ, රජයේ ව්‍යාපෘති 1,300කට අධික සංඛ්‍යාවක් සාර්ථකව නිම කර ඇති අතර, අඩු වියදමකින් උසස් තත්ත්වයේ ප්‍රතිඵල අඛණ්ඩව ලබා දී ඇත. ජාතික ලංසු තැබීම හරහා පෞද්ගලික අංශය සමග තරග කිරීමෙන්, SD & CC රජයට සැලකිය යුතු අරමුදල් ඉතිරි කර ගෙන ඇති අතර එය එසේ නොවුවහොත් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් වෙත යොමු කිරීමට ඉඩ තිබුණි.

අර්බුද ප්‍රතිචාර දැක්වීම සහ හදිසි අවස්ථා වල දී රජයේ ප්‍රමුඛතා සඳහා සහාය.

2024 ජුනි 1 වන දින පැවති බිම් කඩන උත්සවයේ NPP විසින් රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ආයතනවල අත්‍යවශ්‍ය කාර්යභාරය අවධාරණය කළ පිළි, ස්වාභාවික විපත් වැනි හදිසි අවස්ථා වල දී සම්පත් සහ පිරිස් ඉක්මනින් බලමුලු ගැන්වීමේ අසමසම හැකියාවන් SD & CC වැනි රාජ්‍ය ආයතන සතුව ඇත.

කොන්ත්‍රාත් සීමාවන් හෝ ලාභය මත පදනම් වූ ප්‍රමුඛතා වැනි අභියෝගවලට මුහුණ දිය හැකි පෞද්ගලික ආයතන මෙන් නොව, රජයේ නියෝග යටතේ SD &CC වහාම සංවර්ධනය කළ හැකිය. තාවකාලික නවාතැන් ඉදිකිරීම්, යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ සහන මෙහෙයුම් කාර්යක්ෂමව පහසු කිරීම සඳහා මෙම ප්‍රතිචාරාත්මකභාවය ඉතා වැදගත් වේ. එබැවින්, ජාතික හදිසි අවස්ථා සහ ආපදා අවස්ථාවන්හි වටිනා වත්කමක් බව ඔප්පු වී ඇත. උදාහරණ ලෙස යුද්ධය අතරතුර මැණික් ෆාම් හි අවතැන් වූ පුද්ගලයින් සඳහා තාවකාලික නවාතැන් ඉදිකිරීම, මිගමුව සහ හලාවත රෝහල්වල Covid 19 රෝගීන් සඳහා රෝහල් වාට්ටු ඉදිකිරීම සහ Covid-19 රෝගීන් සඳහා ඇඳන් නිප්පාදනය කිරීම ඇතුලත් වේ.සුනාමිය හේතුවෙන් අලුත්ගම දුම්රිය සහ දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනරුත්ථාපනය **කිරීම.**

ඊට අමතරව, 2015 SD & CC විසින් වර්ග අඩි 76,000 ක ගොඩනැගිලි හතරක් මිගමුව රෝහලේ ව්‍යුහාත්මකව නානි වූ අටමහල් ගොඩනැගිල්ලේ රෝගීන්ට පහසුකම් සැලසීම සඳහා රුපියල් මිලියන 250 ක්. SD &CC රෝහලේ ව්‍යුහාත්මක ස්ථායිතාව යථා තත්ත්වයට පත් කළ අතර, අමතර මහලක් එකතු කළ අතර එමගින් රජයට ආසන්න වශයෙන් රුපියල් බිලියන 9 ක් ඉතිරි විය.

වෙළඳපල තුලනය සහ විනිවිදභාවය පවත්වා ගැනීම

රජය සතු ආයතනයක් ලෙස, ලංසු තැබීමේ ක්‍රියාවලීන්හි විනිවිදභාවය වර්ධනය කිරීමෙන් ඉදිකිරීම් වෙළඳපොළේ සමතුලිතතාවය පවත්වා ගැනීමට උපකාරී වේ. එහි පැවැත්ම පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන් අතර අධික ලාභය මත පදනම් වූ හැසිරීම් සීමා කරයි, උද්ධමනය වූ ව්‍යාපෘති පීවැය වළක්වයි සහ මහජන අවශ්‍යතා ආරක්ෂා කරයි.
තවද, උපායමාර්ගික කාර්යභාරය, තිරණාත්මක රජයේ ව්‍යාපෘතිවල ජාතික සංවර්ධන ඉලක්ක සම පෙළගැස්වීම සහතික කරයි.

ඉදිකිරීම් මිල දර්ශක සඳහා දායකත්වය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාිය රජයේ ව්‍යාපෘතිවල මිල උච්චාවචනයන් කළමනාකරණය කිම සඳහා අත්‍යවශ්‍ය වන ඉදිකිරීම් මිල දර්ශක සකස් කිම සඳහා SD & CC වෙතින් ලැබෙන දත්ත මත දැඩි ලෙස විශ්වාසය තබයි. SD & CC විසුරුවා හැරියහොත්, බොහෝ විට පෞද්ගලික ආයතනවලින් ලැබෙන දත්ත මත රඳා පවතිනු ඇති අතර, එමගින් පක්පග්‍රාහී හෝ අසම්පූර්ණ දත්ත හේතුවෙන් රජයේ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට ඉඩ ඇත.

කර්මාන්ත ව්‍යාප්තිය සඳහා ශ්‍රම බලකාය පුහුණුව

ඉදිකිරීම් කර්මාන්තය විදේශීය වෙළඳපොළවල් දක්වා ව්‍යාප්ත කිරීමේ රජයේ දැක්ම රඳා පවතින්නේ කුසලතා සහ අනුවර්තනය කළ හැකි ශ්‍රම බලකායක් මත ය. එහි පුලුල් ව්‍යාපෘති සහ රාජ්‍ය අංශයේ බලතල සහිතව, නිලධාරින් සැබෑ ලෝක තත්වයන් යටතේ ශ්‍රම බලකාය පුහුණුව සඳහා අද්විතීය වේÈකාවකි. න්‍යායාත්මක දැනුම ස්ථානීය අත්දැකිම් සමග එකාබද්ධ කිමෙන් ගෝලීය ප්‍රමිතීන් සපුරාලීමට හැකියාව ඇති වෘත්තිකයන් සූදානම් කළ හැකි අතර එමගින් ජාත්‍යන්තර වෙළඳපොළවල කර්මාන්තයේ තරගකාරිත්වය වැඩි දියුණු කළ හැකිය.
තවද, වර්තමානයේ විශ්ව විද්‍යාල ඉංජිනේරු සිසුන්ට සහ කාර්මික පුහුණු ආයතනවලින් පුහුණුවන්නන්ට ප්‍රායෝගික අත්දැකිම් ලබා දීම ඇතුලුව දහස් ගණනක් තාක්ෂණික වෘත්තිකයන් පුහුණු කිමේදී උපකාරී වී ඇත. සංස්ථාව රජයේ සහ පෞද්ගලික සංවිධාන දෙකටම දායක වන දක්ෂ හා පළපුරුදු ඉංජිනේරුවන් රාශියක් බිහි කර ඇත. එහි වසා දැමීම රැකියා අහිමිවීමට හේතු වන අතර රාජ්‍ය අංශය තුළ තාක්ෂණික විශේෂඥතාවයේ සැලකිය යුතු පරතරයක් ඇති කරන අතර එමගින් තිරණාත්මක යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රටේ ධාරිතාවයට බාධා ඇති වේ.

ලංකාවේ ඉදිකිරීම් අංශයේ ස්ථාවරත්වය

මෑත කාලීන ආර්ථික අර්බුදය හේතුවෙන් සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් අංශය සැලකිය යුතු පසුබෑමකට මුහුණ දී ඇති අතර, පසුගිය වසර දෙක තුන තුළ තියුණු පහත වැටීමක් අත්විඳිමින් සිටී. මෙම පසුබෑම තරුණ, පළපුරුදු ඉංජිනේරුවන්, විශේෂයෙන් කොන්ත්‍රාත්කරු පැත්තේ නියැලී සිටින අය විශාල වශයෙන් පිටව යාමට හේතු වී ඇති අතර, බොහෝ දෙනෙක් විදේශයන්හි අවස්ථා සොයමින් සිටිති. මෙම කාලය තුළ, රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාවේ SD & CC ඉංජිනේරුවන්ගෙන් **60** කට වඩා වැඩි පිරිසක් සංවිධානයෙන් ඉවත් වී ඇති අතර, සැලකිය යුතු සංඛ්‍යාවක් වෙනත් රටවලට සංක්‍රමණය වී ඇත' SD & CC වැනි ස්වයං මූල්‍යකරණ රාජ්‍ය ආයතනයක් වසා දැමීම මෙම ගැටැව තවතිරටත් උග්‍ර කරන අතර රජයේ ප්‍රතිපත්ති සමග ඇති තත්ත්වය ද පරස්පර කරයි.

වැඩිදුර වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා

සංස්ථාව මුහුණ දෙන මූල්‍යමය අභියෝග සැලකිල්ලට ගනිමින්, සීමිත ව්‍යාපෘති සංඛ්‍යාවක්, ආදායම් උත්පාදනයට සාපේක්ෂව ප්‍රධාන කාර්යාලයේ ඉහළ පොදු කාර්ය පිරිවැය සහ පෙර රජය විසින් සිදු කරන ලද දේශපාලන මැදිහත්වීම්වල අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින්, මෙම යෝජනාව උපායමාර්ගිකව මෙහෙයුම් අඩු කර සංස්ථාව සුමටව පවත්වාගෙන යාමට උත්සාහ කරයි. මෙම යෝජනාව සාධාරණීකරණය කිමේදී සඳහන් කර ඇති පිදු ජාතික අවශ්‍යතා සපුරාලන අතරම මෙම අභියෝගවලට මුහුණ දීම සහ රටට දීගුකාලීන ප්‍රතිලාභ ලබා දීම ඉලක්කයයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පහත ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

මූල්‍යමය වශයෙන් ශක්‍ය ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කරන්න.

ඉදිකිරීම් කටයුතුවලට ප්‍රමුඛත්වය දෙන්න, විශේෂයෙන් කොන්ක්‍රීට් අංගන, රථවාහන ආලෝක සංඥා පද්ධති සහ කෙටි කාලීන ආදායම් උත්පාදන විභවයක් සහිත මූල්‍යමය වශයෙන් හොඳ ව්‍යාපෘති ඇතුළත් එවා. මෙය සංස්ථාවේ මූල්‍ය ස්ථාවර කිරීමට උපකාරී වනු ඇත.

මූල්‍ය ස්ථාවරත්වය සඳහා ඉහළ වටිනාකමක් ඇති දේපළ භාවිතා කරන්න.

සංස්ථාව කොළඹ 07 ශ්‍රේගරි මාවතේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලක් ඇතුළු පර්චස් 140 ක දේපලක් බදු දී මෙන් මාසිකව රුපියල් මිලියන තුනක් පමණ උපයමින් සිටී. 2005 වන විට රුපියල් බිලියන 4 ක තක්සේරු වටිනාකමක් ඇති මෙම දේපල (කැබිනට් පත්‍රිකාව (/24/1684/608/032-1) දිනැති 2024.09.10 සැලකිය යුතු ආර්ථික වටිනාකමක් දරයි.

රජයේ ව්‍යාපෘති සෘජුවම ප්‍රදානය කිරීම

ශක්තිමත් කිරීම සහ එහි දායකත්වය හරහා ගැනීම සඳහා, සංස්ථාවට සාධාරණ රජයේ ව්‍යාපෘති සංඛ්‍යාවක් සෘජුවම ප්‍රදානය කිමට යෝජනා කෙරේ. මෙය ජාතික සංවර්ධනයට සහාය වන අතරම රජයට පීරිවැය අඩු කරනු ඇත. උදාහරණයක් ලෙස, කොන්ක්‍රීට් අංගන
වර්තමානයේ තරඟ ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා විනිලිබල මණ්ඩලය සඳහා විදුලි කණු සහ දුම්රිය මාර්ගය සඳහා රේල් සිල්පර නිප්පාදනය කරයි. මෙම ක්‍රියාවලියට ලංසු බැ÷්මකර ඇතුළත් වන අතර එය රජයේ වියදම්වලට එකතු වේ. මෙම ව්‍යාපෘති සෘජුවම ප්‍රදානය කිමෙන්, ලංසු තැබීම සහ ලංසු තැබීමේ බැදුම්කර ආශ්‍රිත පරීවැය ඉවත් කළ හැකි අතර නිප්පාදන පීවැය අඩු කළ හැකි අතර එමඟින් රජයට සැලකිය යුතු ඉතිරික් ලැබේ.

ව්‍යාපෘති බැදුම්කර නිකුත් කිරීම

මූල්‍ය බාධාවන් ලිහිල් කිම සහ මුදල් ප්‍රවාහය වැඩිදියුණු කිරීම සඳහා අනෙකුත් රජයේ සංවිධාන සඳහා සිදු කරන පරිදි, රජයේ ව්‍යාපෘති සඳහා SDCC විසින් දරනු ලබන ලංසු, කාර්ය සාධන සහ අත්තිකාරම් බැදුම්කර නිකුත් කිරීම යෝජනා කරන්න.

ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම

කාර්යක්පමතාව වැඩි දියුණු කිම සහ ශ්‍රම යැපිම අඩු කිරීම සඳහා ඩිජිටල් තාක්පණයන් ක්‍රියාත්මක කරන්න.
සාම්ප්‍රදායික ක්‍රමවලින් පරිගණක පාදක පද්ධති වෙත සංක්‍රමණය වීම මෙහෙයුම් විධිමත් කරනු ඇත.
සහනාධාර, ප්‍රසාද දීමනා, වාර්පික වැටුප් වර්ධක සහ සේවක උසස්වීම් ගණනය කරීම ඇතුලුව.
මෙම මිනුම් සුදුසුකම්, කාර්ය සාධනය, ආදායම් දායකත්වය සහ වැඩ මත පදනම් වනු ඇත
කාර්යක්පමතාව, පිගණක පාදක මගින් කුසලතා පාදක පද්ධති විශ්ලේපණයක් ප්‍රවර්ධනය කිරීම.

තිරසාරභාවය සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ

සංස්ථාව නානිකර දේශපාලන බලපෑම්වලින් ආරක්පා කරීම සඳහා නව ප්‍රතිපත්ති හඳුන්වා දීම සහ බලාත්මක කරීම. මෙම ප්‍රතිසංස්කරණ මගින් සංස්ථාවේ දිගුකාලීන තිරසාරභාවය සහ වර්ධනය සහතික කීම, ස්ථාවර මෙහෙයුම් පරිසරයක් පෝපණය කීම කෙරෙහි අවධානය යොමු කෙරේ
මෙම පියවරයන් මගින් සංස්ථාව මූල්‍ය ප්‍රතිසාධනය සහ මෙහෙයුම් කාර්යක්පමතාව සඳහා ස්ථානගත කිරීම අරමුණු කර ගෙන ඇති අතරම ජාතියේ සංවර්ධන අරමුණු සඳහා දායක වේ.

දස අවුරුදු කාර්ය සාධන සාරාංශය

රු.මි.

විස්තරය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	2024
1. පිරිවැටුම	2,430	2,103	2,348	2,878	4,192	1,449	4,216	2,546	219	430
2. මෙහෙයුම් වියදම්	2,193	1,834	2,175	2,696	4,584	1,338	3,812	2,182	1194	976
3. දල ලාභය	236	269	173	182	(392)	111	403	363	(975)	(546)
4. අනෙකුත් ආදායම්	177	148	172	192	119	327	259	177	88	98
5. පරිපාලන වියදම්	201	199	197	200	229	211	177	310	209	153
6. අනෙකුත් වියදම්	77	104	28	23	125	281	138	89	932	603
7. මූල්‍ය ආදායම්	3	6	11	12	66	61	78	80	155	6
8. මූල්‍ය වියදම්	87	96	119	145	224	209	259	122	387	211
9. බදු වලට පෙර ශුද්ධ ලාභය	50	23	12	19	(844)	(257)	96	27	(2,246)	(1,411)
10. මුලු වත්කම්	4,224	4,472	5,111	6,148	5,472	5,799	6,770	7,593	3,738	3,854
11. ශුද්ධ වත්කම්	1,555	1,500	1,588	1,556	637	310	324	839	(3,262)	(4,563)
12. යෙදවූ ප්‍රාග්ධනය මත ඉපැයීම්%	3.5	6.710	6.43	5.41	-32.69	-3.37	16.11	5.17	146.23	(52.20)
13. වත්කම් මත ඉපැයීම්%	1.19	2.53	2.35	2.46	-11.15	-0.99	5.13	1.86	(54.28)	(0.09)
14. දළ ලාභය %	9.71	12.70	7.38	6.33	-7.75	7.65	9.56	14.28	(445.94)	(126.97)
15. ශුද්ධ ලාභය%	2.0	1.1	0.52	0.64	-16.68	-17.76	2.28	1.06	(1034.29)	(328.14)
16 ජංගම අනුපාතය	1.04	1.04	1.1	1.4	1.16	1.10	1.22	1.20	0.42	0.45